AL/2025/02/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | |
|---|---|---|
| රසායන විද්‍යාව I<br>இரசாயனவியல் I<br>Chemistry I | 02 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **09** කින් යුක්ත වේ.
- ✳ **10** වෙනි පිටුවේ මුද්‍රණය කර ඇති ආවර්තිතා වගුව අවශ්‍ය නම් වෙන් කරගන්න.
- ✳ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ✳ පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත්ව කියවන්න.
- ✳ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගෙන, එය **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$     ප්ලාන්ක්ගේ නියතය $h = 6.626 \times 10^{-34}\ J\ s$

ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$     ආලෝකයේ ප්‍රවේගය $c = 3 \times 10^{8}\ m\ s^{-1}$

1. හෙන්රි බෙකරල් වඩාත්ම ප්‍රචලිත වනුයේ පහත දී ඇති කුමන සොයාගැනීම සඳහා ද?
   (1) පදාර්ථයේ අංශු-තරංග ද්විත්ව ස්වභාවය (2) විකිරණශීලතාව (3) X-කිරණ
   (4) න්‍යෂ්ටියේ ව්‍යුහය (5) නියුට්‍රෝන

2. ක්වොන්ටම් අංක $n = 4$ සහ $l = 2$ වන භූමි අවස්ථාවේ ඇති පරමාණුවක පැවතිය හැකි උපරිම ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව වනුයේ,
   (1) 3 (2) 4 (3) 6 (4) 10 (5) 18

3. H-බන්ධන, අයන-ප්‍රේරිත ද්විධ්‍රැව අන්තර්ක්‍රියා, ද්විධ්‍රැව-ප්‍රේරිත ද්විධ්‍රැව අන්තර්ක්‍රියා සහ ද්විධ්‍රැව-ද්විධ්‍රැව අන්තර්ක්‍රියා වඩාත් හොඳින් පිළිබිඹු කරන උදාහරණ පිළිවෙළින් දක්වා ඇත්තේ,
   (1) ඕතෝ-නයිට්‍රොෆීනෝල්, KI(aq) හි $I_2$, HCl/Ar, ClF
   (2) ඕතෝ-නයිට්‍රොෆීනෝල්, HCl/Ar, KI(aq) හි $I_2$, ClF
   (3) පැරා-නයිට්‍රොෆීනෝල්, ඕතෝ-නයිට්‍රොෆීනෝල්, ClF, KI(aq) හි $I_2$
   (4) පැරා-නයිට්‍රොෆීනෝල්, KI(aq) හි $I_2$, ClF, HCl/Ar
   (5) ඕතෝ-නයිට්‍රොෆීනෝල්, ClF, KI(aq) හි $I_2$, HCl/Ar

4. $CH_2Cl_2$, $CH_4$, $COF_2$ සහ $CH_2F_2$ යන රසායනික විශේෂවල C හි විද්‍යුත් සෘණතාවයන් වැඩිවන නිවැරදි අනුපිළිවෙළ වනුයේ,
   (1) $CH_4 < CH_2Cl_2 < CH_2F_2 < COF_2$
   (2) $CH_2Cl_2 < CH_4 < CH_2F_2 < COF_2$
   (3) $CH_2Cl_2 < CH_4 < COF_2 < CH_2F_2$
   (4) $COF_2 < CH_2F_2 < CH_2Cl_2 < CH_4$
   (5) $CH_4 < CH_2Cl_2 < COF_2 < CH_2F_2$

5. දී ඇති උෂ්ණත්වයකදී දෘඪ-සංවෘත බඳුනක් තුළට $A_2(g)$ සහ $B_2(g)$ 1:3 මවුල අනුපාතයෙන් ඇතුළත් කරන ලදී. එවිට පහත දක්වා ඇති ප්‍රතික්‍රියාව සිදු වේ.

$$A_2(g) + 3B_2(g) \rightleftharpoons 2AB_3(g)$$

   සමතුලිත අවස්ථාවේදී, පද්ධතියෙහි මුළු පීඩනය, $AB_3(g)$ හි ආංශික පීඩනය සහ සමතුලිතතා නියතය පිළිවෙළින් $P_T$, $P_{AB_3}$ සහ $K_P$ වේ. මෙම උෂ්ණත්වයේදී $P_{AB_3} <<< P_T$ නම්, $P_{AB_3}$ හි අගය වන්නේ,

   (1) $\frac{3^{3/2} K_P^{1/2} P_T^2}{4}$ (2) $\frac{3^{3/2} K_P^{1/2} P_T^2}{16}$ (3) $\frac{K_P^{1/2} P_T^2}{16}$ (4) $\frac{K_P^{1/2} P_T^2}{4}$ (5) $\frac{3^3 K_P^{1/2} P_T^2}{16}$

[දෙවැනි පිටුව බලන්න.

Scanned with CamScanner

**6.** **X** සහ **Y** පරමාණු සම්බන්ධ විස්තරයක් පහත දී ඇත. **X** වලට වඩා **Y** බරින් වැඩි ය.

| පරමාණුව | X | Y |
|---|---|---|
| ප්‍රෝටෝන සංඛ්‍යාව | a | 6 |
| නියුට්‍රෝන සංඛ්‍යාව | 7 | b |
| ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව | 6 | c |
| ස්කන්ධ ක්‍රමාංකය | d | e |

**X** සහ **Y** සම්බන්ධයෙන් පහත කුමක් නිවැරදි විය හැකි ද?

(1) a = 7 b = 6 c = 6 d = 13 e = 14
(2) a = 6 b = 7 c = 6 d = 13 e = 14
(3) a = 6 b = 8 c = 6 d = 13 e = 14
(4) a = 7 b = 7 c = 6 d = 14 e = 13
(5) a = 6 b = 8 c = 7 d = 13 e = 14

**7.** දී ඇති සංයෝගයේ IUPAC නම කුමක් ද?



(1) 4-chloro-5-methyl-2-hexynal
(2) 3-chloro-2-formyl-4-hexyne
(3) 4-chloro-5-formyl-2-hexyne
(4) 2-methyl-3-chloro-4-hexynal
(5) 3-chloro-2-methyl-4-hexynal

**8.** $CaCO_3$ සහ $Al_2(CO_3)_3$ පහත දී ඇති ආකාරයට තාප වියෝජනය වේ.

$$CaCO_3(s) \longrightarrow CaO(s) + CO_2(g)$$
$$Al_2(CO_3)_3(s) \longrightarrow Al_2O_3(s) + 3CO_2(g)$$

AL අ8 | @AL_api

$CaCO_3$ සහ $Al_2(CO_3)_3$ හි සම මවුල මිශ්‍රණයක 3.34 g තාප වියෝජනය කළ විට $Al_2(CO_3)_3$ මගින් ලබාදෙන $CO_2$ ප්‍රමාණය කොපමණ ද?
සාපේක්ෂ අණුක ස්කන්ධය: $CO_2$ = 44, $CaCO_3$ = 100, $Al_2(CO_3)_3$ = 234

(1) 0.44 g (2) 1.32 g (3) 1.48 g (4) 1.76 g (5) 1.88 g

**9.** ආලෝකය හමුවේ මීතේන් ක්ලෝරීනීකරණයේදී පහත දැක්වෙන කුමන විශේෂය **නොසෑදේ ද**?

(1) $\dot{C}H_3$ (2) $\dot{C}HCl_2$ (3) $CH_3CH_3$ (4) $CH_2Cl_2$ (5) $H^{\bullet}$

**10.** උෂ්ණත්වය $T$ හිදී $\mathbf{A} \rightarrow \mathbf{P}$ ඒක අණුක ශූන්‍ය පෙළ ප්‍රතික්‍රියාව සලකන්න. උෂ්ණත්වය $T$ හිදී කාලය සමග **A** හි සාන්ද්‍රණයෙහි විචලනය පහත දැක්වෙන කුමන ප්‍රස්තාරය මගින් නිරූපණය කරයි ද?




**11.** $NCO^-$ අයනයෙහි හැඩයට වඩා වෙනස් හැඩයක් ඇති විශේෂය හඳුනාගන්න.

(1) $NO_2^+$ (2) $N_3^-$ (3) $XeF_2$ (4) $CNO^-$ (5) $SF_2$

**12.** අනුමාපන ප්ලාස්කුවකට 0.02 mol dm$^{-3}$ $KIO_3$ ද්‍රාවණයක 25.00 cm$^3$ ක පරිමාවක් එකතු කරන ලදි. ද්‍රාවණය තනුක $H_2SO_4$ වලින් ආම්ලික කර, 0.5 mol dm$^{-3}$ KI ද්‍රාවණයකින් 15 cm$^3$ ක් එකතු කරන ලදි. මුක්ත වූ $I_2$, දර්ශකය ලෙස පිෂ්ඨය භාවිත කරමින්, $Na_2S_2O_3$ ද්‍රාවණයක් සමග අනුමාපනය කරන ලදි. අනුමාපනය සඳහා අවශ්‍ය වූ $Na_2S_2O_3$ ද්‍රාවණයේ පරිමාව 20.00 cm$^3$ විය. $Na_2S_2O_3$ ද්‍රාවණයේ සාන්ද්‍රණය mol dm$^{-3}$ වලින් වනුයේ,

(1) 0.05 (2) 0.075 (3) 0.10 (4) 0.125 (5) 0.15

[තුන්වැනි පිටුව බලන්න.



Scanned with CamScanner

**13.** 23 °C උෂ්ණත්වයේදී NaOH(s) ජලය තුළ ද්‍රාවණය වීමේ එන්තැල්පි වෙනස, $\Delta H$, $-42\ \text{kJ mol}^{-1}$ වේ. පරිවාරක බඳුනක් තුළ 23 °C හි ඇති ජලය 230 g ක NaOH(s) 20 g ක ප්‍රමාණයක් ද්‍රාවණය කරන ලදී. මෙහිදී ලැබුණු ද්‍රාවණයෙහි විශිෂ්ට තාප ධාරිතාව $4.2\ \text{J g}^{-1}\ \text{K}^{-1}$ වේ. ද්‍රාවණයෙහි අවසාන උෂ්ණත්වය කුමක් ද? (භාජනය සමඟ සිදුවන තාප හුවමාරුව නොසලකන්න). H = 1, O = 16, Na = 23

(1) 20 °C (2) 21.7 °C (3) 42 °C (4) 43 °C (5) 44.7 °C

085951

**14.** දී ඇති උෂ්ණත්වයකදී ඒක-ප්‍රෝටික භස්මයක $25.00\ \text{cm}^3$ ක් ඒක-භාස්මික අම්ලයක් සමඟ අනුමාපනයකදී ලබාගත් අනුමාපන වක්‍රය පහත පෙන්වා ඇත.




SA: ප්‍රබල අම්ලය
SB: ප්‍රබල භස්මය
WA: දුබල අම්ලය
WB: දුබල භස්මය
MO: මෙතිල් ඔරේන්ජ්
MR: මෙතිල් රෙඩ්
Ph: ෆිනෝල්ප්තලීන්

පහත සඳහන් කුමන විස්තරය ඉහත පෙන්වා ඇති අනුමාපන වක්‍රය සඳහා නිවැරදි වේ ද?

| | අනුමාපනය | අන්ත ලක්ෂ්‍යයේදී අනුමාපකයේ පරිමාව ($\text{cm}^3$) | අන්ත ලක්ෂ්‍යයේදී pH | සුදුසු දර්ශකය |
|---|---|---|---|---|
| (1) | WA + SB | 12.50 | 5 | MR |
| (2) | SA + WB | 25.00 | 5 | Ph |
| (3) | WA + WB | 12.50 | 9 | Ph |
| (4) | SA + SB | 25.00 | 7 | MO |
| (5) | SA + WB | 25.00 | 5 | MR |

AL අපි | @AL_api

**15.** පහත දක්වා ඇති ප්‍රතික්‍රියා පටිපාටිවලින් කුමක්, 1,2-dibromopropane පිළියෙල කිරීම සඳහා සුදුසු **නොවන්නේ** ද?

(1) $CH_3CH(OH)CH_3 \xrightarrow[\Delta]{\text{සාන්ද්‍ර } H_2SO_4} \xrightarrow{Br_2}$

(2) $CH_3CH(OH)COOH \xrightarrow[(2)\ H^+/H_2O]{(1)\ LiAlH_4/\text{වියළි ඊතර}} \xrightarrow{\text{වැඩිපුර } PBr_3}$

(3) $CH_3C\equiv CH \xrightarrow[\text{ක්විනොලීන්}]{H_2/Pd\text{-}BaSO_4} \xrightarrow{Br_2}$

(4) $CH_3C\equiv CH \xrightarrow{\text{වැඩිපුර } Br_2} \xrightarrow{H_2/Pt}$

(5) $CH_3CH_2CH_2Br \xrightarrow{\text{මධ්‍යසාරීය KOH}} \xrightarrow{Br_2}$

**16.** $H_2(g) + I_2(g) \longrightarrow 2HI(g)$ ප්‍රතික්‍රියාව වේගයෙන් සිදුවන සමතුලිත පියවරකින් පසුව සෙමින් සිදුවන මූලික ප්‍රතික්‍රියා පියවරක් හරහා සිදු වේ. සෙමින් සිදුවන මූලික ප්‍රතික්‍රියා පියවර සඳහා වේග නියමය, වේගය = $k'[H_2(g)][I(g)]^2$ වේ. වේග නියතය $k'$ වේ. $[H_2(g)]$ සහ $[I_2(g)]$ අනුසාරයෙන් සම්පූර්ණ ප්‍රතික්‍රියාවෙහි වේග නියමය පහත සඳහන් කුමක් මගින් ලබා දෙයි ද? $k$ යනු සම්පූර්ණ ප්‍රතික්‍රියාවේ වේග නියතය වේ.

(1) $k[H_2(g)][I_2(g)]$ (2) $k[H_2(g)][I_2(g)]^2$ (3) $k[H_2(g)]^2[I_2(g)]$
(4) $k[H_2(g)][I_2(g)]^3$ (5) $k[H_2(g)]^3[I_2(g)]$

02030001880110951

[හතරවැනි පිටුව බලන්න.

Scanned with CamScanner

**17.** AgBr(s) සහ AgI(s) හි වර්ණයන් පිළිවෙළින් ලා කහ සහ කහ වේ. NaI(aq) ද්‍රාවණයක් AgBr(s) සහිත පරීක්ෂා නළයකට එකතු කරන ලදී. පරීක්ෂා නළයේ අඩංගු දෑ කැලතූ විට, එහි වර්ණය කහ පැහැති විය. මෙම නිරීක්ෂණය පැහැදිලි කිරීම සඳහා පහත දක්වා ඇති අදහස් යෝජනා කරන ලදී.

I. $AgBr(s) + I^-(aq) \longrightarrow AgI(s) + Br^-(aq)$ ප්‍රතික්‍රියාව සිදු වේ.
II. AgBr(s) හි $K_{sp}$ > AgI(s) හි $K_{sp}$
III. AgBr(s) හි $K_{sp}$ < AgI(s) හි $K_{sp}$
IV. $I^-(aq)$ සාන්ද්‍රණය අඩු වේ.
V. $Br^-(aq)$ සාන්ද්‍රණය අඩු වේ.

ඉහත සඳහන් කුමක් මෙම නිරීක්ෂණයට අදාළව නිවැරදි වේ ද?

(1) I, III සහ V (2) I, IV සහ V (3) I, II සහ IV
(4) I, II සහ V (5) I, III සහ IV

**18.** කාමර උෂ්ණත්වයේදී බීකරයක් තුළ තබා ඇති ජලය කුඩා සාම්පලයක්, පැය 6 කට පසුව සම්පූර්ණයෙන් වාෂ්පීකරණය වී ඇති බව සොයාගන්නා ලදී. ජල සාම්පලයට අදාළව මෙම ක්‍රියාවලිය සඳහා පහත දැක්වෙන කුමන විස්තරය නිවැරදි වේ ද?

| | $\Delta H$ | $\Delta S$ | $\Delta G$ |
|---|---|---|---|
| (1) | <>0 | >0 | [illegible] |
| (2) | >0 | <0 | [illegible] |
| (3) | <0 | < | <0 |
| (4) | >0 | >0 | <0 |
| (5) | >0 | < | <0 |

**19.** *d*-ගොනුවේ මූලද්‍රව්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය **වැරදි** වේ ද?

(1) $V_2O_5$ ආම්ලික ඔක්සයිඩයක් වන අතර VO භාස්මික ඔක්සයිඩයක් වේ.
(2) $Mn_3O_4$ හි, මැංගනීස් Mn(II) සහ Mn(III) හි මිශ්‍රණයක් ලෙස පවතී.
(3) $Fe^{3+}$ සහ $Co^{2+}$ අඩංගු ජලීය ද්‍රාවණයකට $NH_4Cl/NH_4OH$ එකතු කළ විට $Fe^{3+}$ පමණක් අවක්ෂේප වේ.
(4) $ZnCl_2(aq)$ ට තනුක NaOH එකතු කිරීමෙන් සෑදෙන සුදු අවක්ෂේපය තනුක HCl හි අද්‍රාව්‍ය වේ.
(5) 3*d* ආන්තරික ශ්‍රේණියෙහි පළමු මූලද්‍රව්‍ය පහ ඒවායේ උපරිම ඔක්සිකරණ අවස්ථා ලබාගනුයේ සියලුම 4*s* හා 3*d* ඉලෙක්ට්‍රෝන පිටකිරීමෙනි.

**20.** පහත දැක්වෙන ප්‍රතික්‍රියාව සලකන්න.




AL අපි | @AL_api

මෙම ප්‍රතික්‍රියාවේ ප්‍රධාන ඵලය වනුයේ කුමක් ද?

(1)



(2)



(3)



(4)



(5)





Scanned with CamScanner

21. $Hg(s) \longrightarrow Hg(l)$, $\Delta H = 2.4\ kJ\ mol^{-1}$ සහ Hg(l) හි සාමාන්‍ය හිමාංකය = −38 °C ලෙස දී ඇති නම් සාමාන්‍ය හිමාංකයේදී Hg(l) 47 g ක් ඝනීභවනය (freeze) වීමේදී සිදුවන එන්ට්‍රොපි වෙනස ($J\ K^{-1}$) වන්නේ කුමක් ද? (Hg = 200)

(1) 14.84 (2) 2.40 (3) −0.49 (4) −2.40 (5) −14.84

22. 25 °C දී $Ni(s) \mid Ni^{2+}(aq, 1.0\ mol\ dm^{-3}) \parallel Cu^{2+}(aq, 1.0\ mol\ dm^{-3}) \mid Cu(s)$ ගැල්වානිය කෝෂයේ ඉලෙක්ට්‍රෝඩ සම්බන්ධ කළ විගස එහි $E^{\circ}_{cell}$ සහ ඉලෙක්ට්‍රෝන ප්‍රවාහය සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්තිය නිවැරදි වේ ද?

25 °C දී, $E^{\circ}_{Cu^{2+}/Cu} = 0.34\ V$ සහ $E^{\circ}_{Ni^{2+}/Ni} = -0.24\ V$

(1) ඉලෙක්ට්‍රෝන ප්‍රවාහය Ni-ඉලෙක්ට්‍රෝඩයේ සිට Cu-ඉලෙක්ට්‍රෝඩයට සිදුවන අතර $E^{\circ}_{cell} = 0.58\ V$
(2) ඉලෙක්ට්‍රෝන ප්‍රවාහය Ni-ඉලෙක්ට්‍රෝඩයේ සිට Cu-ඉලෙක්ට්‍රෝඩයට සිදුවන අතර $E^{\circ}_{cell} = -0.$[illegible] V
(3) ඉලෙක්ට්‍රෝන ප්‍රවාහය Ni-ඉලෙක්ට්‍රෝඩයේ සිට Cu-ඉලෙක්ට්‍රෝඩයට සිදුවන අතර $E^{\circ}_{cell} = 0.1$[illegible] V
(4) ඉලෙක්ට්‍රෝන ප්‍රවාහය Cu-ඉලෙක්ට්‍රෝඩයේ සිට Ni-ඉලෙක්ට්‍රෝඩයට සිදුවන අතර $E^{\circ}_{cell} = 0.58\ V$
(5) ඉලෙක්ට්‍රෝන ප්‍රවාහය Cu-ඉලෙක්ට්‍රෝඩයේ සිට Ni-ඉලෙක්ට්‍රෝඩයට සිදුවන අතර $E^{\circ}_{cell} = 0.$[illegible] V

23. ඩයසෝනියම් අයනය ඉලෙක්ට්‍රොෆයිලයක් ලෙස ක්‍රියාකරන ප්‍රතික්‍රියාව හඳුනාගන්න.

(1) 


(2) 


(3) 


(4) 


(5) 


AL ඇපි | @AL_api

24. විවෘත බඳුනක් තුළ ඇති සංශුද්ධ ද්‍රවයක් රත් කිරීමේදී එය නැටීම (boiling) සිදුවන උෂ්ණත්වයේදී,
(1) ද්‍රවයෙහි මධ්‍ය චාලක ශක්තිය එහි වාෂ්පයෙහි මධ්‍ය චාලක ශක්තියට සමාන වේ.
(2) ද්‍රවයෙහි මධ්‍ය චාලක ශක්තිය එහි වාෂ්පයෙහි මවුලික එන්ට්‍රොපියට සමාන වේ.
(3) ද්‍රවයෙහි එන්ට්‍රොපිය එහි වාෂ්පයේ එන්ට්‍රොපියට සමාන වේ.
(4) ද්‍රවයට ඉහළ ඇති වාෂ්පයෙහි එන්ට්‍රොපිය වායුගෝලයෙහි එන්ට්‍රොපියට සමාන වේ.
(5) ද්‍රවයෙහි වාෂ්ප පීඩනය ද්‍රව පෘෂ්ඨයට ඉහළින් ඇති වායුගෝල පීඩනයට සමාන වේ.

25. 25 °C දී විද්‍යුත් රසායනික කෝෂයක් සඳහා පහත දැක්වෙන තොරතුරු සලකන්න.

| අර්ධ ප්‍රතික්‍රියාව | E°/V |
|---|---|
| $Br_2(l) + 2e \rightleftharpoons 2Br^-(aq)$ | 1.065 |
| $BrO_3^-(aq) + 6H^+(aq) + 5e \rightleftharpoons \frac{1}{2}Br_2(l) + 3H_2O(l)$ | 1.520 |

සම්පූර්ණ කෝෂ ප්‍රතික්‍රියාව, එයට අදාළ $E^{\circ}_{cell}$ සහ මාරුවන ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව පහත සඳහන් කුමක් මගින් නිවැරදිව පෙන්නුම් කරයි ද?

| | සම්පූර්ණ කෝෂ ප්‍රතික්‍රියාව | E°/V | සම්පූර්ණ ප්‍රතික්‍රියාවේදී මාරුවන ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව |
|---|---|---|---|
| (1) | $3Br_2(l) + 3H_2O(l) \rightleftharpoons 5Br^-(aq) + BrO_3^-(aq) + 6H^+(aq)$ | −0.[illegible]0 | 5 |
| (2) | $6Br_2(l) + 6H_2O(l) \rightleftharpoons 10Br^-(aq) + 2BrO_3^-(aq) + 12H^+(aq)$ | 0.9[illegible] | 10 |
| (3) | $5Br^-(aq) + BrO_3^-(aq) + 6H^+(aq) \rightleftharpoons 3Br_2(l) + 3H_2O(l)$ | 0.460 | 10 |
| (4) | $3Br_2(l) + 3H_2O(l) \rightleftharpoons 5Br^-(aq) + BrO_3^-(aq) + 6H^+(aq)$ | −0.9[illegible] | 10 |
| (5) | $5Br^-(aq) + BrO_3^-(aq) + 6H^+(aq) \rightleftharpoons 3Br_2(l) + 3H_2O(l)$ | 0.[illegible] | 5 |

[ගයවැනි පිටුව බලන්න.

085951
01030001880110951
Scanned with CamScanner

**26.** පහත සඳහන් ඔක්සිහරණ/ඔක්සිකරණ (Redox) යුග්ම ඒවායේ ඔක්සිහරණ විභවයන්හි අඩුවන පිළිවෙළට දී ඇත.

$O_2(g)/H_2O(l)$, $Br_2(l)/Br^-(aq)$, $I_2(s)/I^-(aq)$, $H^+(aq)/H_2(g)$, $Cd^{2+}(aq)/Cd(s)$, $Fe^{2+}(aq)/Fe(s)$, $Zn^{2+}(aq)/Zn(s)$, $Al^{3+}(aq)/Al(s)$

පහත දී ඇති කුමන ප්‍රතික්‍රියාව විද්‍යුත් රසායනික කෝෂයක් තුළ ස්වයංසිද්ධව සිදු **නොවේ ද?**

(1) $Zn(s) + Cd^{2+}(aq) \longrightarrow Cd(s) + Zn^{2+}(aq)$
(2) $2Al(s) + 3Br_2(l) \longrightarrow 2Al^{3+}(aq) + 6Br^-(aq)$
(3) $2H_2(g) + O_2(g) \longrightarrow 2H_2O(l)$
(4) $H_2(g) + I_2(g) \longrightarrow 2H^+(aq) + 2I^-(aq)$
(5) $2Al^{3+}(aq) + 3Fe(s) \longrightarrow 2Al(s) + 3Fe^{2+}(aq)$

**27.** **X** සහ **Y** යනු $C_4H_8O_2$ අණුක සූත්‍රය සහිත සංයෝග දෙකකි. **X** සහ **Y**, ප්‍රතිකාරක තුනක් සමග ප්‍රතික්‍රියා කළ විට ලැබෙන නිරීක්ෂණ පහත වගුවේ දක්වා ඇත.

| ප්‍රතිකාරකය | නිරීක්ෂණය | |
|---|---|---|
| | **X** | **Y** |
| Na ලෝහය | වායුවක් පිටවිය | වායුවක් පිටවිය |
| 2, 4-ඩයිනයිට්‍රොෆීනයිල්හයිඩ්‍රසීන් | අවක්ෂේපයක් නැත | වර්ණවත් අවක්ෂේපයකි |
| $Br_2/H_2O$ | විවර්ණ විය | ප්‍රතික්‍රියාවක් නැත |

පහත දී ඇති ව්‍යුහ යුගලවලින් **X** හා **Y** පිළිවෙළින් විය හැක්කේ කුමක් ද?

(1) $CH_3CH(COOH)CH_3$ සහ $CH_3CH(OH)CH_2CHO$
(2) $CH_2{=}CHCH(OH)CH_2OH$ සහ $CH_3C(O)CH_2CH_2OH$
(3) $CH_3CH(CH_3)COOH$ සහ $CH_3C(O)CH(OH)CH_3$
(4) $HOCH_2CH_2CH_2CHO$ සහ $HOCH_2C(CH_2OH){=}CH_2$
(5) $HOCH_2CH{=}CHCH_2OH$ සහ $CH_3CH_2CH_2COOH$

**28** පහත ප්‍රතික්‍රියාවට අනුව manganese(III) fluoride පිළියෙළ කරගත හැක.

$$2MnI_2(s) + 13F_2(g) \longrightarrow 2MnF_3(s) + 4IF_5(l)$$

ප්‍රතිශත අස්වැන්න (% yield) 80% නම්, $MnI_2$ මවුල 0.10 ක් වැඩිපුර $F_2$ සමග ප්‍රතික්‍රියා කර වූ විට, ලැබෙන $MnF_3$ ස්කන්ධය කොපමණ ද?
(F = 19, Mn = 55, I = 127)

$$\% \text{ අස්වැන්න} = \frac{\text{ලැබුණු ස්කන්ධය}}{\text{සෛද්ධාන්තික ස්කන්ධය}} \times 100\%$$

(1) 4.48 g (2) 7.44 g (3) 8.96 g (4) 9.20 g (5) 11.20 g

**29.** 300 K උෂ්ණත්වයේදී දෘඪ-සංවෘත බඳුනක් තුළ සිදු වෙමින් පවතින පහත සමතුලිත ප්‍රතික්‍රියාව සලකන්න.

$$AB(g) + CD_2(s) \rightleftharpoons AD(g) + BD(g) + C(s)$$

300 K දී සිදු කළ පරීක්ෂණයකදී **AB**(g) හි 5% ක් **AD**(g) බවට පත් වී ඇති බව සොයාගන්නා ලද අතර සමතුලිතතාවයේදී පද්ධතියෙහි මුළු පීඩනය 10 atm විය. 300 K දී පද්ධතියෙහි සමතුලිතතා නියතය $K_P$ වන්නේ,

(1) $\frac{(19\times 10)}{21}$ (2) $\frac{10}{(19\times 21)}$ (3) $\frac{0.10}{(19\times 21)}$ (4) $\frac{19\times 19\times 10}{39}$ (5) $\frac{19\times 19\times 0.10}{39}$





AL අපි | @AL_api
Scanned with CamScanner

**30.** දී ඇති උෂ්ණත්වයකදී $P \rightleftharpoons Q$ සමතුලිත ප්‍රතික්‍රියාවක කාලය සමග ඉදිරි සහ පසු ප්‍රතික්‍රියාවල වේගයන්හි සිදු වන වෙනස්වීම් පහත රූපසටහන-I පෙන්වයි. කාලය $t$ හිදී පද්ධතියට P තවත් යම් ප්‍රමාණයක් එක් කළ විට ඉදිරි ප්‍රතික්‍රියාවේ වේගයෙහි සිදු වන වෙනස ද රූපසටහන-I පෙන්වයි. ආපසු ප්‍රතික්‍රියාවේ වේගයෙහි සිදු වන වෙනස රූපසටහන-II හි කුමන රේඛාව ($A, B, C, D$ හෝ $E$) මගින් පෙන්වයි ද?



රූපසටහන-I



රූපසටහන-II

(1) $A$ (2) $B$ (3) $C$ (4) $D$ (5) $E$

- අංක **31** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති $(a)$, $(b)$, $(c)$ සහ $(d)$ යන ප්‍රතිචාර හතර අතුරෙන්, එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය/ප්‍රතිචාර කවරේ දැ'යි තෝරා ගන්න.

  $(a)$ සහ $(b)$ පමණක් නිවැරදි නම් (1) මත ද
  $(b)$ සහ $(c)$ පමණක් නිවැරදි නම් (2) මත ද
  $(c)$ සහ $(d)$ පමණක් නිවැරදි නම් (3) මත ද
  $(d)$ සහ $(a)$ පමණක් නිවැරදි නම් (4) මත ද
  **වෙනත්** ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද

  පිළිතුරු පත්‍රයෙහි දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

**ඉහත උපදෙස් සම්පිණ්ඩනය**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| $(a)$ සහ $(b)$ පමණක් නිවැරදියි | $(b)$ සහ $(c)$ පමණක් නිවැරදියි | $(c)$ සහ $(d)$ පමණක් නිවැරදියි | $(d)$ සහ $(a)$ පමණක් නිවැරදියි | **වෙනත්** ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

**31.** බ්‍රෝමොබෙන්සීන්, සාන්ද්‍ර $HNO_3$/සාන්ද්‍ර $H_2SO_4$ සමග සිදු වන නයිට්‍රෝකරණයේ යන්ත්‍රණය සලකන්න. මෙම ප්‍රතික්‍රියාව සිදු වන විටදී සෑදෙන අයනය/අයන පහත දී ඇති කුමන ව්‍යුහය/ව්‍යුහ මගින් නිරූපණය වන්නේ ද?

$(a)$ 


$(b)$ 


$(c)$ 


$(d)$ 


**32.** දී ඇති උෂ්ණත්වයකදී දෘඪ-සංවෘත බඳුනක් තුළ පහත සමතුලිතතාවය පවතී.

$$CO(g) + 2O_2(g) \rightleftharpoons 2CO_2(g) : \Delta H < 0$$

පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ මෙම පද්ධතිය සඳහා නිවැරදි වේ ද?

$(a)$ එම උෂ්ණත්වයේදීම වැඩිපුර $CO_2(g)$ එකතු කිරීමේදී $CO(g)$ ප්‍රමාණය වැඩි වීමත් සමග සමතුලිතතා නියතයෙහි අගය වෙනස් වේ.
$(b)$ පද්ධතියේ උෂ්ණත්වය වැඩි කිරීමේදී $CO(g)$ ප්‍රමාණය වැඩි වීමත් සමග සමතුලිතතා නියතයෙහි අගය අඩු වේ.
$(c)$ එම උෂ්ණත්වයේදීම වැඩිපුර $CO(g)$ එකතු කිරීමේදී $CO_2(g)$ ප්‍රමාණය වැඩි වීමත් සමග සමතුලිතතා නියතයෙහි අගය වෙනස් නොවේ.
$(d)$ එම උෂ්ණත්වයේදීම වැඩිපුර $CO_2(g)$ එකතු කිරීමේදී $O_2(g)$ ප්‍රමාණය වැඩි වීමත් සමග සමතුලිතතා නියතයෙහි අගය වැඩි වේ.

**33.** පහත ප්‍රකාශ කාර්මික ක්‍රියාවලින් හා සම්බන්ධ වේ. ඒවා අතුරෙන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි ද?

$(a)$ හේබර්-බොෂ් ක්‍රියාවලිය මගින් $NH_3$ නිෂ්පාදනයේදී උත්ප්‍රේරකයක් අවශ්‍ය නොවේ.
$(b)$ සබන් පිරිපහදු කිරීමේදී සිට්රික් අම්ලය භාවිත කරයි.
$(c)$ ඩව් (Dow) ක්‍රියාවලිය මගින් Mg නිස්සාරණයේදී වායුගෝලයට $CO_2$ එක්වන්නේ හුනුගල් හෝ ඩොලමයිට් තාප වියෝජනයෙන් පමණකි.
$(d)$ පටල කෝෂ ක්‍රමය මගින් NaOH නිෂ්පාදනයේදී ප්‍රධාන අතුරු ඵලය HCl වේ.

[අවවැනි පිටුව බලන්න.

Scanned with CamScanner

**34.** s-ගොනුවේ මූලද්‍රව්‍ය සම්බන්ධව කුමන වගන්තිය/වගන්ති නිවැරදි ද?

(a) II වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවල ලෝහක අරයන් ඊට අනුරූපී I වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවල ලෝහක අරයන්ට වඩා අඩු ය.

(b) II වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවල පළමු අයනීකරණ ශක්තීන් ඊට අනුරූපී I වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවල පළමු අයනීකරණ ශක්තීන්ට වඩා වැඩි ය.

(c) II වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවල ඝනත්වයන් I වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවල ඝනත්වයන්ට වඩා අඩු ය.

(d) II වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවලට, I වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවලට වඩා දුර්වල ලෝහක බන්ධන ඇත.

**35.** ජලීය NaOH සමග **A** කාබනික සංයෝගය රත් කළ විට ඇමෝනියා මුක්ත කරයි. **A** ආම්ලිකෘත $K_2Cr_2O_7$ සමග රත් කළ විට සෑදෙන සංයෝගය 2, 4-ඩයිනයිට්‍රොෆීනයිල්හයිඩ්‍රසීන් සමග වර්ණවත් අවක්ෂේපයක් ලබාදෙයි. පහත දැක්වෙන ඒවායින් **A** විය හැක්කේ කුමක්/කුමන ඒවා ද?

(a) 


(b) 


(c) 


(d) 


**36.** **X** නමැති සංශුද්ධ ද්‍රව්‍යයෙහි කලාප සටහන පහත දැක්වේ.




AL අපි | @AL_api

පහත සඳහන් වගන්තිවලින් කුමක්/කුමන ඒවා නිවැරදි ද?

(a) පීඩනය වැඩි වීමේදී ද්‍රවය ඝනයක් බවට පත් කිරීමට අවශ්‍ය උෂ්ණත්වය අඩු වේ.

(b) පීඩනය 1.0 atm ට වඩා වැඩි වන විට ද්‍රවයෙහි හිමාංකය, එහි සාමාන්‍ය හිමාංකයට වඩා වැඩි ය.

(c) A යනු **X** හි ත්‍රික ලක්ෂ්‍යය වේ.

(d) 100 °C ට වඩා වැඩි උෂ්ණත්වයේදී වායුව ද්‍රවයක් බවට පත් කිරීම සඳහා 1.0 atm ට වඩා වැඩි පීඩනයක් අවශ්‍ය වේ.

**37.** වායුගෝලීය ඕසෝන් ගැන මින් කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය ද?

(a) වැඩිම ඕසෝන් සාන්ද්‍රණය ඇත්තේ පොළව මට්ටමේ ය.

(b) ස්ථර ගෝලීය ඕසෝන් මිනිස් ජීවිත ආරක්ෂා කරයි.

(c) පොළව මට්ටමේ ඇති ඕසෝන් සෑදීමට මෝටර් රථ විමෝචනයන් දායක වේ.

(d) ඕසෝන් වියනේදී ඕසෝන් සෑදීම හා විනාශ වීම UV කිරණ ඇති විට සිදු වේ.

**38.** පහත දී ඇති ප්‍රතික්‍රියාව සඳහා 25 °C දී එන්තැල්පි වෙනස, $\Delta H$, –126 kJ වේ.

$$2Na_2O_2(g) + 2H_2O(l) \longrightarrow 2NaOH(aq) + O_2(g)$$

25 °C දී $Na_2O_2(s)$ දෙන ලද ප්‍රමාණයක් වැඩිපුර ජලයට එකතු කළ විට සිදු වන එන්තැල්පි වෙනස පිළිබඳව පහත සඳහන් කුමන වගන්තිය/වගන්ති නිවැරදි ද?

(H = 1, O = 16, Na = 23)

(a) $Na_2O_2(s)$ මවුල එකක් එකතු කළ විට 63.0 kJ ශක්තියක් මුදා හරී.

(b) $Na_2O_2(s)$ 39 g එකතු කළ විට 31.5 kJ ශක්තියක් උරාගනී.

(c) $Na_2O_2(s)$ මවුල එකක් එකතු කළ විට 63.0 kJ ශක්තියක් උරාගනී.

(d) $Na_2O_2(s)$ 39 g එකතු කළ විට 31.5 kJ ශක්තියක් මුදා හරී.

[නවවැනි පිටුව බලන්න.



Scanned with CamScanner

**39.** හයිඩ්‍රජන් හේලයිඩ සම්බන්ධව පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි ද?

(a) හයිඩ්‍රජන් හේලයිඩ ජලයේදී ආම්ලික වේ.
(b) හයිඩ්‍රජන් හේලයිඩවල බන්ධන විඝටන ශක්තීන් කාණ්ඩය පහළට යන විට අඩු වේ.
(c) හයිඩ්‍රජන් හේලයිඩවල අම්ල ප්‍රබලතාවය කාණ්ඩය පහළට යන විට අඩු වේ.
(d) හයිඩ්‍රජන් හේලයිඩවල බන්ධන දිග කාණ්ඩය පහළට යන විට අඩු වේ.

**40.** ස්පර්ශ ක්‍රමය මගින් $H_2SO_4$ නිෂ්පාදනය හා සම්බන්ධ පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?

(a) $2SO_2(g) + O_2(g) \rightleftharpoons 2SO_3(g)$ ප්‍රතික්‍රියාව තාප අවශෝෂක වේ.
(b) මෙම ක්‍රියාවලිය සඳහා පොදුවේ භාවිත කරනු ලබන උත්ප්‍රේරකය Fe වේ.
(c) $SO_2$ උත්ප්‍රේරක කුටීර හතරකදී $SO_3$ බවට පරිවර්තනය කෙරේ.
(d) මෙම ක්‍රියාවලියේදී 1 atm ට වඩා වැඩි පීඩන භාවිත නොවේ.

- අංක **41** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට **හොඳින්ම** ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන පරිදි (1), (2), (3), (4) සහ (5) යන ප්‍රතිචාරවලින් කවර ප්‍රතිචාරය දැ'යි තෝරා පිළිතුරු පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය වේ. | සත්‍ය වන අතර, පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි. |
| (2) | සත්‍ය වේ. | සත්‍ය වන නමුත් පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහදා **නොදෙයි.** |
| (3) | සත්‍ය වේ. | අසත්‍ය වේ. |
| (4) | අසත්‍ය වේ. | සත්‍ය වේ. |
| (5) | අසත්‍ය වේ. | අසත්‍ය වේ. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **41.** | ආවර්තිතා වගුවේ දෙවන ආවර්තයේ මූලද්‍රව්‍ය අතුරින්, N සහ Be වල ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ ශක්තිය ධන අගයකි. | වෙනත් ඉලෙක්ට්‍රෝන වින්‍යාසවලට වඩා අර්ධ වශයෙන් පිරුණු සහ පූර්ණ වශයෙන් පිරුණු කවචවලට වැඩි ස්ථායිතාවයක් ඇත. |
| **42.** | එස්ටර සහ ග්‍රිනාඩ් ප්‍රතිකාරක අතර ප්‍රතික්‍රියාව මගින් කීටෝන සාදාගත නොහැක. | එස්ටරවලට වඩා වැඩි වේගයෙන් කීටෝන ග්‍රිනාඩ් ප්‍රතිකාරක සමග ප්‍රතික්‍රියා කරයි. |
| **43.** | රේචනය කරන ලද දෘඪ-සංවෘත භාජනයක ජලය 100 °C ට වඩා අඩු උෂ්ණත්වයකදී නටයි. | බාහිර පීඩනය අඩු විට ද්‍රව කලාපයේ සිට වාෂ්ප කලාපයට ජල අණු මුදාහැරීම පහසු වේ. |
| **44.** | $H_2O$, $H_2S$ සහ $H_2Se$ වල බන්ධන කෝණ $H_2O > H_2S > H_2Se$ යන පිළිවෙළට අඩු වේ. | $H_2O$, $H_2S$ සහ $H_2Se$ වල මධ්‍ය පරමාණුවේ විද්‍යුත් සෘණතාවය $O > S > Se$ යන පිළිවෙළට අඩු වේ. |
| **45.** | වායුගෝලීය ජල වාෂ්ප ගෝලීය උණුසුම ඉහළ යාමට දායක වේ. | ජල වාෂ්ප හරිතාගාර වායුවකි. |
| **46.** | ජලය සඳහා විලයනයේ එන්තැල්පිය $\Delta H_{fus}$, එහි වාෂ්පීකරණයේ එන්තැල්පියට $\Delta H_{vap}$ වඩා අඩු ය. | වාෂ්පීකරණයට සාපේක්ෂව විලයනයේදී ජල අණු වඩා වැඩි දුරකට ඈත් වීම සිදු වේ. |
| **47.** | වැඩිපුර ජලීය NaOH සමග $CH_3COCl$ ප්‍රතික්‍රියා කර $CH_3COO^-Na^+$ සාදයි. | අම්ල ක්ලෝරයිඩ සමග ජලීය NaOH ප්‍රතික්‍රියාවේදී චතුස්තලීය අතරමැදි ඵලයක් සෑදේ. |
| **48.** | pH = 5 දී $Cu(OH)_2(s)$ හි ද්‍රාව්‍යතාවය pH = 10 දී ට වඩා වැඩි ය. | ආම්ලික ද්‍රාවණවලදී $OH^-$ උදාසීනිකරණය වේ. |
| **49.** | $Na_2CO_3$ කාර්මිකව නිෂ්පාදනයේදී ඇමෝනිකරණය, කාබොනිකරණයට පෙර සිදු කරයි. | ඇමෝනිකරණය කරන ලද බ්‍රයින් ද්‍රාවණයකට $CO_2$ යැවූ විට $(NH_4)_2CO_3$ ඉහළ සාන්ද්‍රණයකින් නිපදවේ. |
| **50.** | ආම්ලික මාධ්‍යයේදී, එය සමග ප්‍රතික්‍රියාකරන විශේෂය අනුව $H_2O_2$ වලට ඔක්සිකාරකයක් ලෙස හෝ ඔක්සිහාරකයක් ලෙස ක්‍රියා කළ හැක. | ඔක්සිජන් පෙන්වන ඔක්සිකරණ අවස්ථා අතුරින්, 0 වඩාත්ම ස්ථායි හා බහුල වේ. |

***

AL අපි | @AL_api

Scanned with CamScanner

AL/2025/02/S-II(A)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | | |
|---|---|---|---|
| රසායන විද්‍යාව | II | | |
| இரசாயனவியல் | II | 02 S II | |
| Chemistry | II | | |

| | | | |
|---|---|---|---|
| පැය තුනයි | | අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மூன்று மணித்தியாலம் | | மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Three hours | | Additional Reading Time | - 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

* ආවර්තිතා වගුවක් 16 වැනි පිටුවෙහි සපයා ඇත.
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* සාර්වත්‍ර වායු නියතය, $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
* ඇවගාඩ්රෝ නියතය, $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
* **මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී ඇල්කයිල් කාණ්ඩ සංක්ෂිප්ත ආකාරයකින් නිරූපණය කළ හැකි ය.**

**උදාහරණය:**  කාණ්ඩය $CH_3CH_2-$ ලෙස දැක්විය හැකි ය.

- **A කොටස - ව්‍යුහගත රචනා (පිටු 2 - 8)**

* **සියලුම** ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
* ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්නයට ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මෙ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බවද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බවද සලකන්න.

- **B කොටස සහ C කොටස - රචනා (පිටු 9 - 15)**

* එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.
* සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස් තුනට පිළිතුරු, **A** කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයෙහි **B** සහ **C** කොටස් **පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |

**එකතුව**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| පරීක්ෂා කළේ : | |
| අධීක්ෂණය කළේ : | |

Scanned with CamScanner

[දෙවැනි පිටුව බලන්න.

## A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න හතරටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

මෙම තීරයේ කිසිවක් නොලියන්න

1. (*a*) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද නැතහොත් අසත්‍ය ද යන බව තිත් ඉරි මත සඳහන් කරන්න. හේතු අවශ්‍ය නැත.

   (i) දෙන ලද උපකවචයක ඉලෙක්ට්‍රෝන යුගල් වීම, එම උපකවචයේ සියලුම කාක්ෂිකවල ඉලෙක්ට්‍රෝන සමාන්තර බැම්ම සහිතව, තනි තනිව පිරෙන තෙක්, සිදු නොවේ. ..................

   (ii) ක්වොන්ටම් අංක $n$ සහ $l$ මගින් හැඳින්වෙන පරමාණුක කාක්ෂික. (I) $n = 4$ $l = 1$ (II) $n = 4$ $l = 0$ (III) $n = 3$ $l = 2$. ශක්තීන් වැඩි වන පිළිවෙළට (III) < (II) < (I) ලෙස තැබිය හැක. ..................

   (iii) $SOF_4$ අණුවේ ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය සමචතුරස්‍ර පිරමිඩාකාර වේ. ..................

   (iv) Li හි දෙවන අයනීකරණ ශක්තිය Be හි එම අගයට වඩා අඩු ය. ..................

   (v) ෆ්ලුවොරීන්හි ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ ශක්තිය සෘණ අගයකි. ..................

   (vi) Be, C, Si සහ S යන පරමාණුවල පරමාණුක අරයයන් C < Be < S < Si යන පිළිවෙළට වැඩි වේ. ..................

   (vii) $CH_3NH_2$ හි තාපාංකය $CH_3F$ හි එම අගයට වඩා වැඩි ය. ..................

   (viii) $Al^{3+}$, $O^{2-}$, $F^-$ සහ $S^{2-}$ හි අයනික අරයයන් $S^{2-} > F^- > O^{2-} > Al^{3+}$ යන පිළිවෙළට අඩු වේ. ..................

(ලකුණු 32 යි)

(*b*) (i) $ClSO_2F$ අණුව සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් තිත්-ඉරි ව්‍යුහය අඳින්න.

   (ii) ඉහත (i) හි අඳින ලද ව්‍යුහයේ S වල ඔක්සිකරණ අවස්ථාව දෙන්න.

   S ..................................

   (iii) $HN_2O_2^-$ අයනය සඳහා ස්ථායි ලුවිස් තිත්-ඉරි ව්‍යුහයක් පහත දක්වා ඇත. මෙම අයනය සඳහා තවත් ලුවිස් තිත්-ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) දෙකක් අඳින්න. දී ඇති ව්‍යුහයට සාපේක්ෂව ඔබ විසින් අඳින ලද එක් එක් ව්‍යුහයෙහි ස්ථායිතාවය දැක්වීමට ස්ථායි, අස්ථායි හෝ අඩු ස්ථායි ලෙස ව්‍යුහය යටින් ලියා දක්වන්න.



Chemistryplus
Scanned with CamScanner

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(iv) පහත සඳහන් ලුවිස් තිත්-ඉරි ව්‍යුහය සහ එහි ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

$:\ddot{\underset{..}{F}}-\ddot{N}=\overset{\oplus}{N}=\ddot{N}-\overset{\ominus}{\underset{..}{\ddot{N}}}-H$ $\qquad$ $F-N^1-N^2-N^3-N^4-H$

| | | $N^1$ | $N^2$ | $N^3$ | $N^4$ |
|---|---|---|---|---|---|
| I. | පරමාණුව වටා VSEPR යුගල් සංඛ්‍යාව | | | | |
| II. | පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | | | | |
| III. | පරමාණුව වටා හැඩය | | | | |
| IV. | පරමාණුවේ මුහුම්කරණය | | | | |

- කොටස් (v) සිට (viii), ඉහත (iv) කොටසෙහි දෙන ලද ලුවිස් තිත්-ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iv) කොටසෙහි ආකාරයටම වේ.

(v) පහත දැක්වෙන පරමාණු දෙක අතර $\sigma$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක/මුහුම් කාක්ෂික හඳුනාගන්න.

I. $N^1-F$ $\quad N^1$ .............................. $\quad F$ ..............................

II. $N^1-N^2$ $\quad N^1$ .............................. $\quad N^2$ ..............................

III. $N^2-N^3$ $\quad N^2$ .............................. $\quad N^3$ ..............................

IV. $N^3-N^4$ $\quad N^3$ .............................. $\quad N^4$ ..............................

V. $N^4-H$ $\quad N^4$ .............................. $\quad H$ ..............................

(vi) පහත දැක්වෙන පරමාණු දෙක අතර $\pi$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න.

I. $N^1-N^2$ $\quad N^1$ .............................. $\quad N^2$ ..............................

II. $N^2-N^3$ $\quad N^2$ .............................. $\quad N^3$ ..............................

(vii) $N^1$, $N^2$, $N^3$ සහ $N^4$ පරමාණු වටා බන්ධන කෝණවල ආසන්න අගයන් සඳහන් කරන්න.

$N^1$..........., $N^2$..........., $N^3$..........., $N^4$...........

(viii) $N^1$, $N^2$, $N^3$ සහ $N^4$ පරමාණු ඒවායේ විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙළට සකසන්න.

........... < ........... < ........... < ...........

(ලකුණු 52 යි)

(c) (i) පහත දැක්වෙනුයේ තුන්වන ආවර්තයට අයත් වන මූලද්‍රව්‍යයක ප්‍රථම අයනීකරණ ශක්තියේ ($IE_1$) සිට අනුයාත අයනීකරණ ශක්තීන් හය, $IE_1-IE_6$ (kJ/mol වලින්) වේ.

| $IE_1$ | $IE_2$ | $IE_3$ | $IE_4$ | $IE_5$ | $IE_6$ |
|---|---|---|---|---|---|
| 1012 | 1903 | 2910 | 4956 | 6248 | 22230 |

මූලද්‍රව්‍යය හඳුනාගෙන, එහි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

I. මූලද්‍රව්‍යය : ........................................

II. ඉලෙක්ට්‍රෝන වින්‍යාසය : ........................................

Chemistryplus

Scanned with CamScanner

මෙම තීරුවේ කිසිවක් නොලියන්න

(ii) $AX_5$ යන සූත්‍රය ඇති අණුවක A—X σ බන්ධන පහක් ඇත. මෙහි A සහ X මූලද්‍රව්‍යවල සංකේත නිරූපණය කරන අතර A මධ්‍ය පරමාණුව වේ.
තිබිය හැකි අණුක හැඩය නම් කරමින් සහ එක් එක් හැඩයට උදාහරණයක් දෙමින් (අණුක සූත්‍ර අවශ්‍ය වේ) පහත වගුව සම්පූර්ණ කරන්න.

| | අණුක හැඩය | උදාහරණය |
|---|---|---|
| I. $AX_5$ ධ්‍රැවීය නම් | | |
| II. $AX_5$ නිර්ධ්‍රැවීය නම් | | |

(ලකුණු 16 යි)

100

2. (*a*) (i) **A** ජලයෙහි ද්‍රාව්‍ය සුදු පැහැති සංයෝගයකි. එය 4:2:3 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය තුනකින් (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට) සමන්විත වේ. එක් එක් මූලද්‍රව්‍යයෙහි පරමාණුක ක්‍රමාංකය 20 ට වඩා අඩු වේ. මින් මූලද්‍රව්‍ය දෙකක් ආවර්තිතා වගුවේ *p*-ගොනුවට අයත් වේ. **A** රත් කිරීමේදී, එක් ඵලයක් ලෙස, අවර්ණ, විෂ නොවන, උදාසීන, රේඛීය ව්‍යුහයක් ඇති ත්‍රිපරමාණුක වායුවක් පිටවේ. **A** පොහොරක් වශයෙන් භාවිත වේ.

**A** හඳුනාගන්න. ..........................................

(ii) **B** ද ජලයෙහි ද්‍රාව්‍ය සුදු පැහැති සංයෝගයකි. එය **A** හි මූලද්‍රව්‍ය තුනෙන්ම සමන්විත වේ. මෙම මූලද්‍රව්‍ය 4:2:2 අනුපාතයෙන් ඇත (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට). **B** රත් කිරීමේදී, අවර්ණ, ගන්ධයක් නොමැති, අධික බන්ධන විඝටන ශක්තියක් ඇති සම ද්විපරමාණුක වායුවක් පිටවේ. මෙම වායුව, කාර්මිකව, ද්‍රව වාතය භාගික ආසවනයෙන් ලබා ගනු ලැබේ.

**B** හඳුනාගන්න. ..........................................

(iii) **C** සුදු පැහැති අයනික සංයෝගයකි. එය 8:2:4:1 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය හතරකින් (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට) සමන්විත වේ. එක් එක් මූලද්‍රව්‍යයෙහි පරමාණුක ක්‍රමාංකය 20 ට වඩා අඩු වේ. මින් මූලද්‍රව්‍ය තුනක් **A** හා **B** යන දෙකෙහිම අඩංගු වේ. **C** රත් කිරීමේදී, ප්‍රබල ගන්ධයක් ඇති, අවර්ණ, භාස්මික **X** වායුව සහ ප්‍රබල අම්ලයක් සෑදේ. **C** හි ජලීය ද්‍රාවණයකට $BaCl_2(aq)$ එක් කළ විට, තනුක HCl හි අද්‍රාව්‍ය සුදු පැහැති අවක්ෂේපයක් ලැබේ.

**C** හඳුනාගන්න. ..........................................

(iv) **D** සුදු පැහැති අයනික සංයෝගයකි. එය 8:1:2:3 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය හතරකින් (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට) සමන්විත වේ. මින් මූලද්‍රව්‍ය තුනක් **A**, **B** හා **C** සංයෝග තුනෙහිම අඩංගු වේ. **D** රත් කිරීමේදී, ලැබෙන ඵලවලින් දෙකක් ලෙස, **X** වායුව සහ හුනු දියර කිරිපැහැ ගන්වන තවත් වායුවක් ලැබේ.

**D** හඳුනාගන්න. ..........................................

(v) **E** ප්‍රබල අම්ලයකි. එය **A** හා **B** හි මූලද්‍රව්‍යවලින්ම සමන්විත වේ. ඒවා 3:1:1 අනුපාතයෙන් ඇත (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට **නොවේ**). **E** ප්‍රබල ඔක්සිකාරකයකි. **E** නිෂ්පාදනය සඳහා **X** භාවිත වේ.

**E** හඳුනාගන්න. ..........................................

(ලකුණු 40 යි)

(*b*) ඉහත (*a*) හිදී හඳුනාගත් **A**, **B**, **C** හා **D** රත් කිරීමේදී සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

**A** ..........................................................................................

**B** ..........................................................................................

**C** ..........................................................................................

**D** ..........................................................................................

(ලකුණු 32 යි)

CS Scanned with CamScanner

[පස්වැනි පිටුව බලන්න.

Scanned with CamScanner

මෙම තීරුවේ කිසිවක් නොලියන්න

(*c*) (i) ඉහත (*a*) කොටසේ තොරතුරු මත පදනම්ව **X** හඳුනාගන්න.

.............................................................................................................

(ii) **X** භාවිත කොට, ඉහත (*a*)(v) කොටසේදී හඳුනාගත් **E** නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය නම් කරන්න.

.............................................................................................................

(iii) ඉහත ක්‍රියාවලිය සඳහා භාවිත කරන අනෙක් අමුද්‍රව්‍යය/අමුද්‍රව්‍ය සඳහන් කරන්න.

.............................................................................................................

(iv) I. වැඩිපුර $Cl_2(g)$ සමග **X** ප්‍රතික්‍රියා කළ විට එක් ඵලයක් ලෙස **Y** සංයෝගය සෑදේ. මෙම ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

.............................................................................................................

II. **Y** ජලය සමග ප්‍රතික්‍රියා කළ විට ජලය විෂබීජහරණය (disinfect) සඳහා භාවිත කළ හැකි සංයෝගයක් සෑදේ. **Y** ජලය සමග ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

.............................................................................................................

(v) **X** හඳුනාගැනීම සඳහා එක් රසායනික පරීක්ෂණයක්, නිරීක්ෂණය සමග දෙන්න.

පරීක්ෂණය : .............................................................................................

නිරීක්ෂණය : .............................................................................................

(ලකුණු 28 යි) 100

3. (*a*) HX(aq) යනු 25 °C දී $pK_a = 4$ වන දුබල අම්ලයකි.

(i) ජලීය ද්‍රාවණයකදී HX(aq) හි අයනීකරණය සඳහා සමීකරණය ලියන්න.

(ii) ඉහත (i) හි සමතුලිතතා නියතය සඳහා ප්‍රකාශනය ලියන්න.

(iii) උෂ්ණත්වය 25 °C දී, 0.01 mol $dm^{-3}$ HX(aq) ද්‍රාවණයක pH ගණනය කරන්න.

(iv) උෂ්ණත්වය 25 °C දී 0.02 mol $dm^{-3}$ NaOH(aq) ද්‍රාවණයකින් 10.00 $cm^3$ පරිමාවක් 0.01 mol $dm^{-3}$ HX(aq) ද්‍රාවණයේ 25.00 $cm^3$ කට එකතු කරන ලදී.

I. ලැබෙන ද්‍රාවණයෙහි පවතින රසායනික විශේෂ ලියන්න.

II. මෙම වර්ගයේ ද්‍රාවණ පොදුවේ හඳුන්වනු ලබන්නේ කුමක් ලෙස ද?

Chemistryplus

Scanned with CamScanner

[හතරවැනි පිටුව බලන්න.

මෙම තීරුවේ කිසිවක් නොලියන්න

III. මෙම ද්‍රාවණයෙහි pH ගණනය කිරීම සඳහා ප්‍රකාශනය ලියන්න.

IV. මෙම ද්‍රාවණයෙහි pH ගණනය කරන්න (1–10 සඳහා ලඝු අගයන් පහත දී ඇත).

| සංඛ්‍යාව | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලඝු අගය | 0.00 | 0.30 | 0.48 | 0.60 | 0.70 | 0.78 | 0.85 | 0.90 | 0.95 | 1.00 |

V. pH = 4.00 ද්‍රාවණයක් ලබාගැනීම සඳහා 0.01 mol $dm^{-3}$ HX(aq) ද්‍රාවණයක 100.00 $cm^3$ සමග මිශ්‍ර කිරීමට අවශ්‍ය 0.02 mol $dm^{-3}$ NaOH(aq) ද්‍රාවණයක පරිමාව ගණනය කරන්න.

Chemistryplus

(ලකුණු 70 යි)

(*b*) 25 °C දී, $MgF_2$(s) ජලයෙහි මද වශයෙන් ද්‍රාව්‍ය වේ ($K_{sp} = 6.4 \times 10^{-9}$ $mol^3\ dm^{-9}$). 0.20 mol $dm^{-3}$ NaF(aq) ද්‍රාවණයක 500.00 $cm^3$ හි සම්පූර්ණයෙන්ම ද්‍රාව්‍ය වන උපරිම $MgF_2$(s) ස්කන්ධය ගණනය කරන්න. $MgF_2$(s) එකතු කිරීමෙන් ද්‍රාවණයෙහි පරිමාව වෙනස් නොවන බව උපකල්පනය කරන්න. (F = 19, Mg = 24)

100

(ලකුණු 30 යි)

CS Scanned with CamScanner



Scanned with CamScanner

4. (*a*) පහත දක්වා ඇති ප්‍රතික්‍රියා පටිපාටිය සලකන්න. එහි,

- **A** යනු අණුක සූත්‍රය $C_5H_{10}$ වූ හයිඩ්‍රොකාබනයකි.
- **D** හි අණුක සූත්‍රය $C_5H_{10}O_2$ වේ. එය ප්‍රකාශ සමාවයවිකතාවය දක්වයි. **D** ජලීය $Na_2CO_3$ සමග ප්‍රතික්‍රියා කළ විට, $CO_2$ මුක්ත වේ.
- **J** හි අණුක සූත්‍රය $C_5H_8$ වේ. **J** ඇමෝනීකෘත $AgNO_3$ සමග අවක්ෂේපයක් ලබා දේ.




(i) **A, B, C, D, E, F, G** සහ **J** හි ව්‍යුහයන් අදාළ කොටු තුළ අඳින්න.

**A**

**B**

**C**

**D**

**E**

**F**

**G**

**J**

Chemistryplus
Scanned with CamScanner

මෙම තීරුවේ කිසිවක් නො ලියන්න

- $HgSO_4$/ තනුක $H_2SO_4$ සමග **J** ප්‍රතික්‍රියා කළ විට **K** සෑදේ. **K** එක් (01) පියවරකින් **G** බවට පරිවර්තනය කළ හැක.

  (ii) අදාළ කොටු තුළ **K** හි ව්‍යුහය ඇද **K**, **G** බවට පරිවර්තනය කිරීම සඳහා භාවිත කළ හැකි ප්‍රතිකාරක/ය දෙන්න.

| **K** | ප්‍රතිකාරක/ය |
|---|---|
| | |

(ලකුණු 60 යි)

(*b*) පහත දක්වා ඇති ප්‍රතික්‍රියා සඳහා ප්‍රතික්‍රියා වර්ගය [නියුක්ලියෝෆිලික ආකලනය ($A_N$), ඉලෙක්ට්‍රෝෆිලික ආකලනය ($A_E$), නියුක්ලියෝෆිලික ආදේශය ($S_N$), ඉලෙක්ට්‍රෝෆිලික ආදේශය ($S_E$), ඉවත් කිරීම (E)] සහ ප්‍රධාන ඵලය වගුවෙහි අදාළ කොටු තුළ ලියන්න.

| | ප්‍රතික්‍රියාව | ප්‍රතික්‍රියා වර්ගය | ප්‍රධාන ඵලය |
|---|---|---|---|
| (i) | $CH_3CH{=}C(CH_3){-}CH_3 \xrightarrow{Br_2}$ | | |
| (ii) | $CH_3CH_2CH(OH)CH_2CH_3 \xrightarrow[\text{තාපය}]{\text{නිර්ජලීය } Al_2O_3}$ | | |
| (iii) | $CH_3CH_2CH_2OH \xrightarrow{HBr}$ | | |

(ලකුණු 18 යි)

(*c*) පහත දී ඇති ප්‍රතික්‍රියාවෙහි ප්‍රධාන ඵලය **L** හි ව්‍යුහය අඳින්න. මෙම ප්‍රතික්‍රියාවෙහි යාන්ත්‍රණය ලියන්න.




**L**

යාන්ත්‍රණය:

100

(ලකුණු 22 යි)

Chemistryplus
Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

රසායන විද්‍යාව II
இரசாயனவியல் II
Chemistry II

02 S II

* සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ \text{J K}^{-1}\ \text{mol}^{-1}$
* ඇවගාඩ්‍රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ \text{mol}^{-1}$

## B කොටස — රචනා

ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට **ලකුණු 150** බැගින් ලැබේ.)

5. (*a*) $N_2(g)$ හි 1.0 mol ක් සහ $H_2(g)$ හි 2.0 mol ක් කලින් රේචනය කරන ලද පරිමාව 1.0 $dm^3$ වන දෘඩ-සංවෘත භාජනයක් තුළ 450 °C උෂ්ණත්වයේදී මිශ්‍ර කර පහත සමතුලිතතාවයට එළඹීමට ඉඩ හරින ලදී.

$$N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g)$$

සමතුලිතතාවයේදී $NH_3(g)$ හි 1.0 mol ක් ඇති බව සොයාගන්නා ලදී.

(i) 450 °C දී සමතුලිතතා පද්ධතියෙහි මුළු පීඩනය ගණනය කරන්න (450 °C දී $RT = 6 \times 10^3\ \text{J mol}^{-1}$).

(ii) 450 °C දී සමතුලිතතා පද්ධතියේ $N_2(g)$, $H_2(g)$ සහ $NH_3(g)$ හි ආංශික පීඩන ගණනය කරන්න.

(iii) 450 °C දී පද්ධතියෙහි සමතුලිතතා නියතය $K_P$ ගණනය කරන්න.

(iv) ඉහත (iii) හි ලබාගත් $K_P$ අගය භාවිතයෙන් 450 °C දී පද්ධතියෙහි සමතුලිතතා නියතය $K_C$ ගණනය කරන්න.

(v) 450 °C දී ඉහත පද්ධතියට Ar(g) හි 1.0 mol ක් එකතු කළ විට $N_2(g)$, $H_2(g)$ සහ $NH_3(g)$ හි ආංශික පීඩන අගයන්හි හා $K_P$ අගයෙහි කිසියම් වෙනස්වීම සිදු වන්නේ නම් ඒවා දක්වන්න (ගණනය කිරීම අවශ්‍ය **නොවේ**).

**(ලකුණු 60 යි)**

AL අපි | @AL_api

(*b*) $N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g)$ ප්‍රතික්‍රියාවෙහි $\Delta H^\circ$ සහ $\Delta S^\circ$ උෂ්ණත්වය සමග වෙනස් නොවන බව උපකල්පනය කරන්න.

(i) පද්ධතියේ උෂ්ණත්වය වැඩි කළ විට $NH_3(g)$ හි සමතුලිත සාන්ද්‍රණය මත ඇතිවන බලපෑම පුරෝකථනය කරන්න.

(ii) ඉහත ප්‍රතික්‍රියාව සඳහා $\Delta H^\circ = -90\ \text{kJ mol}^{-1}$ සහ $\Delta S^\circ = -200\ \text{J K}^{-1}\ \text{mol}^{-1}$ වේ.
27 °C සහ 527 °C දී ප්‍රතික්‍රියාවෙහි $\Delta G^\circ$ අගයන් ගණනය කිරීමෙන් ඉහත (i) හි ඔබ සිදු කළ පුරෝකථනය නිවැරදි බව පෙන්වන්න.

(iii) 450 °C දී සංවෘත-දෘඩ භාජනය තුළ සිදුවෙමින් පවතින $2NH_3(g) \rightleftharpoons N_2(g) + 3H_2(g)$ ප්‍රතික්‍රියාව සලකන්න.

I. උෂ්ණත්වය වැඩි කිරීමේදී $\left(\dfrac{[NH_3(g)]^2}{[N_2(g)][H_2(g)]^3}\right)$ හි අගය මත ඇතිවන බලපෑම පුරෝකථනය කරන්න.

II. ඉහත ප්‍රතික්‍රියාව සඳහා 450 °C දී උත්ප්‍රේරකයක් ඇති විට සහ නොමැති විට සමතුලිතතාවයට එළඹීමට ගතවන කාලය පිළිබඳව අදහස් දක්වන්න.

III. ඉහත II හි ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

**(ලකුණු 60 යි)**

(*c*) (i) සංශුද්ධ ද්‍රව්‍යයක 'සාමාන්‍ය තාපාංකය' අර්ථ දක්වන්න.

(ii) සංශුද්ධ $CCl_4(l)$ හි තාපාංකයේදී පවතින සමතුලිතතාවය ලියන්න.

(iii) $\Delta H^\circ_{CCl_4(g)} = -95\ \text{kJ mol}^{-1}$, $\Delta H^\circ_{CCl_4(l)} = -128\ \text{kJ mol}^{-1}$
$\Delta S^\circ_{CCl_4(g)} = 309\ \text{J K}^{-1}\ \text{mol}^{-1}$, $\Delta S^\circ_{CCl_4(l)} = 214\ \text{J K}^{-1}\ \text{mol}^{-1}$ බව දී ඇත.
$CCl_4(l)$ හි සාමාන්‍ය තාපාංකය ගණනය කරන්න.

**(ලකුණු 30 යි)**

[දහවැනි පිටුව බලන්න.

Scanned with CamScanner

6. (*a*) 25 °C දී $2NO(g) + Cl_2(g) \rightarrow 2NOCl(g)$ ප්‍රතික්‍රියාව සලකන්න.

25 °C දී ඉහත ප්‍රතික්‍රියාව සඳහා සිදු කරන ලද ආරම්භක-වේග පරීක්ෂණයක ප්‍රතිඵල පහත දක්වා ඇත. $[NO(g)]_0$ සහ $[Cl_2(g)]_0$ යනු පිළිවෙළින් NO(g) හා $Cl_2(g)$ හි ආරම්භක සාන්ද්‍රණ වේ.

| පරීක්ෂණය | $[NO(g)]_0$/mol dm$^{-3}$ | $[Cl_2(g)]_0$/mol dm$^{-3}$ | $\frac{-\Delta[Cl_2(g)]}{\Delta t}$/mol dm$^{-3}$ s$^{-1}$ |
|---|---|---|---|
| 1 | 0.25 | 0.50 | 0.75 |
| 2 | 0.25 | 1.00 | 3.00 |
| 3 | 0.50 | 2.00 | 24.00 |

(i) ප්‍රතික්‍රියාව සඳහා සමීකරණයේ දැක්වෙන එක් එක් විශේෂයට අනුබද්ධව ප්‍රතික්‍රියාවේ වේගය සඳහා ප්‍රකාශන ලියන්න.

(ii) NO(g) ට හා $Cl_2(g)$ ට සාපේක්ෂව ප්‍රතික්‍රියාවෙහි පෙළ පිළිවෙළින් **a** හා **b** සහ වේග නියතය *k* වේ නම් ප්‍රතික්‍රියාව සඳහා වේග ප්‍රකාශනය/නියමය ලියන්න.

(iii) **a** හා **b** හි අගයයන් සහ ප්‍රතික්‍රියාවේ සම්පූර්ණ පෙළ ගණනය කරන්න.

(iv) 25 °C දී ප්‍රතික්‍රියාවෙහි වේග නියතය *k* ගණනය කරන්න.

(v) 25 °C දී NO(g) සහ $Cl_2(g)$ හි ආරම්භක සාන්ද්‍රණ පිළිවෙළින් 0.50 සහ 0.10 mol dm$^{-3}$ වන විට $Cl_2(g)$ වැයවන වේගය ගණනය කරන්න.

(vi) 25 °C දී $Cl_2(g)$ වැයවන වේගය 4.5 mol dm$^{-3}$ s$^{-1}$ වන විට 25 °C දී NOCl(g) සෑදෙන වේගය ගණනය කරන්න.

(vii) 25 °C දී NO(g) සහ $Cl_2(g)$ හි ආරම්භක සාන්ද්‍රණ පිළිවෙළින් 0.20 සහ 0.30 mol dm$^{-3}$ වන විට NOCl(g) සෑදෙන වේගය ගණනය කරන්න.

AL අපි | @AL_api

(ලකුණු 75 යි)

(*b*) Cu කුඩු නයිට්‍රික් අම්ලය සමග ප්‍රතික්‍රියාවේදී N සහ O අඩංගු රතු-දුඹුරු වායුවක් සෑදේ. 33 °C දී සිදු කළ පරීක්ෂණයකදී සෑදුන වායුව 150 cm$^3$ බඳුනක් තුළට එකතු කරගන්නා ලදී. වායුවෙහි පීඩනය සහ ස්කන්ධය පිළිවෙළින් 831.4 mm Hg සහ 0.300 g විය. සෑදුන වායුවෙහි මවුලික ස්කන්ධය ගණනය කර එහි රසායනික සූත්‍රය දෙන්න. යොදාගත් උපකල්පන/උපකල්පනය සඳහන් කරන්න. (1 mm Hg = 133.3 Pa, N = 14, O = 16)

(ලකුණු 35 යි)

(*c*) දී ඇති උෂ්ණත්වයකදී එක හා සමාන A හා B භාජන දෙකක් තුළ පිළිවෙළින් සංශුද්ධ ජලය සහ 3.0 mol dm$^{-3}$ ග්ලිසරෝල් ජලීය ද්‍රාවණ සමාන පරිමා අඩංගු වේ.

(i) A හා B වල අඩංගු දෑහි වාෂ්ප පීඩන

(ii) A හා B වල අඩංගු දෑහි තාපාංක

හේතු දක්වමින් සංසන්දනය කරන්න.

(ලකුණු 15 යි)

(*d*) දී ඇති උෂ්ණත්වයකදී සංවෘත භාජනයක් තුළ C හා D ද්‍රව මිශ්‍ර කිරීමෙන් පරිපූර්ණ ද්වයංගී ද්‍රව මිශ්‍රණයක් සාදන ලදී. මෙම උෂ්ණත්වයේදී C හා D හි වාෂ්ප පීඩන පිළිවෙළින් $P_C$ සහ $P_D$ වන අතර C හා D හි සංතෘප්ත වාෂ්ප පීඩන පිළිවෙළින් $P_C^\circ$ සහ $P_D^\circ$ වේ. ද්‍රව කලාපයෙහි C සහ D හි මවුලභාගයන් පිළිවෙළින් $X_C$ සහ $X_D$ විය.

(i) මෙම උෂ්ණත්වයේදී C හි සාපේක්ෂ වාෂ්ප පීඩන-පාතනය සඳහා ප්‍රකාශනය ව්‍යුත්පන්න කරන්න.

(ii) 25 °C දී ජලය 900 g ක් තුළ ග්ලිසරෝල් 1.0 mol ක් දිය කිරීමෙන් ද්‍රාවණයක් සාදන ලදී. එහි

I. සාපේක්ෂ වාෂ්ප පීඩන-පාතනය (mm Hg)

II. වාෂ්ප පීඩනය (mm Hg)

ගණනය කරන්න.

25 °C දී ජලයෙහි සංතෘප්ත වාෂ්ප පීඩනය 24 mm Hg වේ. (H = 1, O = 16)

25 °C දී ග්ලිසරෝල්වල සංතෘප්ත වාෂ්ප පීඩනය නොගිනිය හැකි තරම් කුඩා වේ.

(ලකුණු 25 යි)

[එකොළොස්වැනි පිටුව බලන්න.

Scanned with CamScanner

7. (*a*) 25 °C දී $3Cu^{+}(aq) + Au^{3+}(aq) \rightarrow 3Cu^{2+}(aq) + Au(s)$ ප්‍රතික්‍රියාවෙහි විද්‍යුත් රසායනික හැසිරීම අධ්‍යයනය කිරීම සඳහා පහත විස්තර කරන විද්‍යුත් රසායනික කෝෂය ගොඩනගන ලදී. මෙම කෝෂය, බීකරයක ඇති 1.0 mol dm$^{-3}$ $Au(NO_3)_3(aq)$ ද්‍රාවණයක ගිල්වන ලද Au(s) ඉලෙක්ට්‍රෝඩය සහ වෙනත් බීකරයක ඇති එකිනෙක 1.0 mol dm$^{-3}$ වන $CuNO_3(aq)$ සහ $Cu(NO_3)_2(aq)$ ද්‍රාවණයක් තුළ ගිල්වා ඇති Pt(s) ඉලෙක්ට්‍රෝඩයකින් සමන්විත වේ. මෙම අර්ධ-කෝෂ දෙක සංතෘප්ත $KNO_3(aq)$ ද්‍රාවණයකින් පුරවන ලද ලවණ-සේතුවකින් සහ වෝල්ට්මීටරයකින් සම්බන්ධ කර ඇත.

25 °C දී $E^{\circ}_{Au^{3+}(aq)/Au(s)} = 1.50$ V සහ $E^{\circ}_{Cu^{2+}(aq)/Cu^{+}(aq)} = 0.16$ V වේ.

(i) මෙම විද්‍යුත් රසායනික කෝෂයෙහි දළ සටහන අඳින්න.

(ii) මෙම විද්‍යුත් රසායනික කෝෂයෙහි ඇනෝඩය සහ කැතෝඩය හඳුනාගෙන ඒවාට අදාළ අර්ධ ප්‍රතික්‍රියා ලියන්න.

(iii) මෙම විද්‍යුත් රසායනික කෝෂයෙහි ධන සහ සෘණ අග්‍ර හඳුනාගන්න.

(iv) 25 °C දී $E^{\circ}_{cell}$ ගණනය කරන්න.

(v) මෙම කෝෂය ක්‍රියාකරන විට Pt(s) ඉලෙක්ට්‍රෝඩයෙහි ස්කන්ධය වැඩි වේ ද, අඩු වේ ද, වෙනස් නොවේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(vi) කෝෂය ක්‍රියාත්මක වීමට පෙර සහ පසු Au(s)-අර්ධ කෝෂයෙහි අඩංගු වන අයනික විශේෂයන් සඳහන් කරන්න.

(vii) 25 °C දී මිනිත්තු 30 ක් කෝෂය ක්‍රියාත්මක වූ පසු Au(s) ඉලෙක්ට්‍රෝඩය මත Au(s) 0.197 g ක් තැන්පත් විය.

I. තැන්පත් වූ Au මවුල සංඛ්‍යාව ගණනය කරන්න. (Au = 197 g mol$^{-1}$)

II. මිනිත්තු 30 ක් තුළ කෝෂය හරහා ගමන් කළ ධාරාව නියතව තිබූ බව උපකල්පනය කරමින් එම ධාරාව (mA) ගණනය කරන්න.

(ලකුණු 75 යි)

AL අපි | @AL_api

(*b*) (i) **A**, **B**, **C**, **D** හා **E** සංගත සංයෝග වේ. ඒවාට අෂ්ටතලීය ජ්‍යාමිතියක් ඇත.

I. පහත දී ඇති ලැයිස්තුවෙන් සුදුසු විශේෂ තෝරාගනිමින්, මෙම සංගත සංයෝගයන්හි ව්‍යුහ සූත්‍ර දෙන්න හෝ ව්‍යුහ අඳින්න.

$Na^{+}, Cu^{+}, Cu^{2+}, Br^{-}, NH_3$

**A** : ලෝහ අයනයට ලිගන වර්ග දෙකක් එක හා සමාන සංඛ්‍යාවකින් සංගත වී ඇත. එහි සංකීර්ණ අයනයට −1 ක ආරෝපණයක් ඇත.

**B** : ලෝහ අයනයට ලිගන වර්ග දෙකක් සංගත වී ඇත. **B** හි ජලීය ද්‍රාවණයකට $AgNO_3(aq)$ එක් කළ විට, සාන්ද්‍ර $NH_4OH$ හි ද්‍රාව්‍ය ලා කහ පැහැති අවක්ෂේපයක් සෑදේ.

**C** හා **D** : **C** හා **D** හි එකම මූලද්‍රව්‍යයන් අඩංගු වේ. එනමුත්, **C** හි සංකීර්ණ අයනයට −2 ක ආරෝපණයක් ඇති අතර, **D** හි එම අයනයට −3 ක ආරෝපණයක් ඇත.

**E** : ලෝහ අයනයට එක් ලිගන වර්ගයක් පමණක් සංගත වී ඇත. ජලීය ද්‍රාවණයේදී, **E** අයන දෙකක් දෙයි.

**සැ.යු.** : ● සංකීර්ණ අයනයක, ලිගන කිහිපයක් සංගත වූ එක් ලෝහ අයනයක් ඇත.

II. **E** හි IUPAC නම දෙන්න.

(ii) **X** හා **Y** *d*-ගොනුවේ M(II) නම් ලෝහ අයනයක සංකීර්ණ අයන වේ.

ඒවාට තලීය සමචතුරස්‍රාකාර ජ්‍යාමිතියක් ඇත.

**X** : එතිලීන්ඩයිඇමීන් පමණක් M(II) ට සංගත වී ඇත.

**Y** : එතිලීන්ඩයිඇමීන් හා $H_2O$, M(II) ට සංගත වී ඇත.

**X** හා **Y** හි ව්‍යුහ සූත්‍ර ලියා, ඒවායෙහි ව්‍යුහ අඳින්න.

**සැ.යු.** : ● සංකීර්ණ අයනයක, ලිගන කිහිපයක් සංගත වූ එක් ලෝහ අයනයක් ඇත.

● එතිලීන්ඩයිඇමීන්හි ව්‍යුහය $NH_2—CH_2—CH_2—NH_2$ වේ.

● එතිලීන්ඩයිඇමීන් N පරමාණු දෙකෙන්ම M(II) ට සංගත වේ.

● ව්‍යුහ සූත්‍රයෙහි එතිලීන්ඩයිඇමීන් නිරූපණය කිරීම සඳහා 'en' භාවිත කරන්න. (ලකුණු 75 යි)

[දහතුන්වැනි පිටුව බලන්න.

Scanned with CamScanner

## C කොටස — රචනා

ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට **ලකුණු 150** බැගින් ලැබේ.)

**8.** (*a*) 2-Methylpropanamide ආරම්භක සංයෝගය ලෙස භාවිත කරමින් **S** සංයෝගය සෑදීම සඳහා ප්‍රතික්‍රියා පටිපාටියක් පහත දී ඇත.




**P**, **Q** සහ **R** සංයෝගයන්හි ව්‍යුහ ඇඳීමෙන් සහ ප්‍රතික්‍රියා **1 – 4** සඳහා සුදුසු ප්‍රතිකාරක දී ඇති ලැයිස්තුවෙන් **පමණක්** තෝරාගෙන ලිවීමෙන්, ඉහත දී ඇති ප්‍රතික්‍රියා පටිපාටිය සම්පූර්ණ කරන්න.

**ප්‍රතිකාරක ලැයිස්තුව:**
$LiAlH_4$/වියළි ඊතර්, $NaNO_2$, තනුක HCl, පිරිඩීනියම් ක්ලෝරෝක්‍රෝමේට් (PCC), $C_6H_5NH_2$

(ලකුණු 35 යි)

AL අපි | @AL_api

(*b*) 2-Methyl-2-butene සහ HBr අතර සිදුවන ප්‍රතික්‍රියාව සලකන්න.

(i) මෙම ප්‍රතික්‍රියාවේදී සෑදීමට ඉඩ ඇති ඵල දෙකෙහි ව්‍යුහ දෙන්න.

(ii) ප්‍රතික්‍රියා වර්ගය සඳහන් කරමින් සහ ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය සලකමින්, මෙම ඵල දෙකෙන් කුමක් ප්‍රධාන ඵලය වන්නේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 30 යි)

(*c*) ෆීනෝල් සහ ඇසිටික් අම්ලය යන සංයෝග දෙක සලකන්න.

(i) මෙම සංයෝග දෙකෙන් වඩා ආම්ලික වන්නේ කුමක්දැයි සඳහන් කරන්න.

(ii) එක් එක් සංයෝගය සඳහා ජලීය මාධ්‍යයේදී පවතින සමතුලිතතාවයන් සඳහා රසායනික සමීකරණ ලියන්න.

(iii) ඉහත (ii) පිළිතුරෙහි ලියා ඇති, කාබනික රසායනික විශේෂයන්හි සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න.

(iv) සම්ප්‍රයුක්ත ව්‍යුහ සලකමින්, ඉහත (i) කොටසේ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 50 යි)

(*d*) පහත දැක්වෙන පරිවර්තනය පියවර **පහකට (05)** නොවැඩි සංඛ්‍යාවකින් ඔබ සිදු කරන ආකාරය පෙන්වන්න.




(ලකුණු 35 යි)



Scanned with CamScanner

9. (*a*) **Y** ජලීය ද්‍රාවණයෙහි **P, Q, R** හා **S** කැටායන හතරක් අඩංගු වේ. මෙම කැටායන හඳුනාගැනීම සඳහා පහත දී ඇති පරීක්ෂණ පිළිවෙළින් සිදු කරන ලදී.

| | පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|---|
| 1 | තනුක HCl මගින් **Y** ආම්ලික කරන ලදී. | සුදු අවක්ෂේපයක් (**$P_1$**) |
| 2 | **$P_1$** පෙරා වෙන් කර, ලැබෙන පෙරණය තුළින් $H_2S$ බුබුලනය කරන ලදී. | අවක්ෂේපයක් නොමැත |
| 3 | $H_2S$ මුළුමනින්ම ඉවත් කිරීම සඳහා ඉහත පෙරණය නටවන ලදී. සාන්ද්‍ර $HNO_3$ බිංදු කිහිපයක් එක් කර, ද්‍රාවණය නටවා, සිසිල් කර, $NH_4Cl/NH_4OH$ එක් කරන ලදී. | දුඹුරු අවක්ෂේපයක් (**$Q_1$**) |
| 4 | **$Q_1$** පෙරා වෙන් කර, ලැබෙන පෙරණය තුළින් $H_2S$ බුබුලනය කරන ලදී. | කළු අවක්ෂේපයක් (**$R_1$**) |
| 5 | **$R_1$** පෙරා වෙන් කර, $H_2S$ මුළුමනින්ම ඉවත් කිරීම සඳහා ලැබෙන පෙරණය නටවා, සිසිල් කර, $NH_4Cl/NH_4OH$ එක් කරන ලදී. මෙම ද්‍රාවණය රත් කර, වැඩිපුර $(NH_4)_2CO_3(aq)$ එක් කරන ලදී. | සුදු අවක්ෂේපයක් (**$S_1$**) |

අවක්ෂේප සඳහා පහත පරීක්ෂා සිදු කරන ලදී.

| අවක්ෂේපය | පරීක්ෂාව | නිරීක්ෂණය |
|---|---|---|
| **$P_1$** | **$P_1$** ට තනුක $NH_4OH$ එක් කරන ලදී. | අවර්ණ ද්‍රාවණයක් (**$P_2$**) |
| | **$P_2$** හි කොටස්වලට වෙන් වෙන් වශයෙන් පහත ද්‍රාවණ එක් කරන ලදී. | |
| | I. $KI(aq)$ | ලා කහ අවක්ෂේපයක් (**$P_3$**) |
| | II. $Na_2S_2O_3(aq) / \Delta$ | කළු අවක්ෂේපයක් (**$P_4$**) |
| **$Q_1$** | තනුක $HNO_3$ හි **$Q_1$** ද්‍රවණය කරන ලදී. ලැබෙන ද්‍රාවණයෙහි කොටස්වලට වෙන් වෙන් වශයෙන් පහත ද්‍රාවණ එක් කරන ලදී. | |
| | I. $NH_4SCN(aq)$ | තද රතු ද්‍රාවණයක් (**$Q_2$**) |
| | II. $K_4[Fe(CN)_6](aq)$ | තද නිල් අවක්ෂේපයක් (**$Q_3$**) |
| **$R_1$** | උණුසුම් තනුක HCl හි **$R_1$** ද්‍රවණය කර, ද්‍රාවණය සිසිල් කර, ලැබෙන ද්‍රාවණයෙහි කොටස්වලට වෙන් වෙන් වශයෙන් පහත ද්‍රාවණ එක් කරන ලදී. | |
| | I. තනුක $NH_4OH$ බිංදු කිහිපයක් | කොළ අවක්ෂේපයක් (**$R_2$**) |
| | II. වැඩිපුර තනුක $NH_4OH$ | තද නිල් ද්‍රාවණයක් (**$R_3$**) |
| | III. තනුක $NH_4OH$ බිංදු කිහිපයක්/ ඩයිමෙතිල්ග්ලයොක්සිම් (DMG) | තද රතු අවක්ෂේපයක් (**$R_4$**) |
| **$S_1$** | තනුක HCl හි **$S_1$** ද්‍රවණය කරන ලදී. ලැබෙන ද්‍රාවණයෙහි කොටස්වලට වෙන් වෙන් වශයෙන් පහත ද්‍රාවණ එක් කරන ලදී. | |
| | I. තනුක $H_2SO_4$ | තනුක $HNO_3$ හි අද්‍රාව්‍ය සුදු අවක්ෂේපයක් (**$S_2$**) |
| | II. $K_2CrO_4(aq)$ | කහ අවක්ෂේපයක් (**$S_3$**) |
| | **$S_1$** පහන්සිළු පරීක්ෂාවට භාජනය කරන ලදී. | ලා කොළ දැල්ලක් |

**P, Q, R** සහ **S** කැටායන හතර හඳුනාගන්න. එක් එක් කැටායනය ආශ්‍රිත සංයෝග/විශේෂ **$P_1 - P_4$, $Q_1 - Q_3$, $R_1 - R_4$** සහ **$S_1 - S_3$** හි රසායනික සූත්‍ර ලියන්න.

**සැ.යු. :** රසායනික සමීකරණ සහ හේතු **අනවශ්‍යයි.**

**(ලකුණු 75 යි)**

[දහතුන්වැනි පිටුව බලන්න.

AL අපි | @AL_api

Scanned with CamScanner

(*b*) සිඩරයිට් (siderite) නැමති ඛනිජයෙහි ප්‍රධාන වශයෙන් $FeCO_3$ අඩංගු වේ. හුනුගල්වල ඇති $CaCO_3$ හි අඩංගු කැල්සියම් අයන ($Ca^{2+}$), දිගු කලක් තිස්සේ ෆෙරස් අයන ($Fe^{2+}$) මගින් විස්ථාපනය වූ විට සිඩරයිට් සෑදේ. මේ නිසා සිඩරයිට්හි ඇති $FeCO_3$, $CaCO_3$ සමග මිශ්‍රව පවතී. මීට අමතරව සිලිකා වැනි අපද්‍රව්‍ය ද සුළු වශයෙන් සිඩරයිට්වල අඩංගු වේ.

මෙවැනි සිඩරයිට් සාම්පලයක 8.5 g, ඔක්සිජන් රහිත තත්ත්ව යටතේ 900 °C හිදී නියත ස්කන්ධයක් දක්වා තාප වියෝජනය කරන ලදී. එවිට ඉතිරිවන සාම්පලයේ ස්කන්ධය 5.2 g විය. තාප වියෝජනයේදී $CaCO_3$, $CaO$ බවටත් $FeCO_3$, $FeO$ බවටත් පරිවර්තනය වේ.

ඉහත සිඩරයිට් සාම්පලයෙන් තවත් 1.7 g වැඩිපුර තනුක $H_2SO_4$ අම්ලයෙහි දියකර, පෙරා, ලැබෙන ද්‍රාවණය $100.00\ cm^3$ දක්වා ආසුත ජලයෙන් තනුක කරන ලදී. මෙහිදී ලැබෙන ද්‍රාවණයෙන් $25.00\ cm^3$, $0.04\ mol\ dm^{-3}$ $KMnO_4$ ද්‍රාවණයක් සමග අනුමාපනය කළ විට අන්ත ලක්ෂයේදී $KMnO_4$ පාඨාංකය $12.50\ cm^3$ විය.

සිඩරයිට් සාම්පලයෙහි ඇති Fe සහ Ca හැර වෙනත් ලෝහ ප්‍රමාණ නොගිනිය යුතු තරම් කුඩා යැයි උපකල්පනය කරන්න.

(C = 12, O = 16, Ca = 40, Fe = 56)

(i) සිඩරයිට් සාම්පලයෙහි ඇති $CaCO_3$ ස්කන්ධ ප්‍රතිශතය ගණනය කරන්න.

(ii) සිඩරයිට් සාම්පලයෙහි ඇති $CaCO_3$ වලට අමතරව ඇති අපද්‍රව්‍යවල ප්‍රතිශතය ගණනය කරන්න.

(iii) සිඩරයිට් සාම්පලයෙහි 8.5 g ඔක්සිජන් හමුවේ තාප වියෝජනය කළ විට $FeCO_3$, $Fe_2O_3$ සහ $Fe_3O_4$ මවුල අනුපාතය 1:1 වන පරිදි වියෝජනය වන අතර $CaCO_3$, $CaO$ බවට වියෝජනය වේ. මෙම තාප වියෝජනයෙන් පසුව ඉතිරිවන අවශේෂයෙහි ස්කන්ධය ගණනය කරන්න.

(ලකුණු 75 යි)

AL අපි | @AL_api

**10.** (*a*) $TiO_2$ හි කාර්මික නිෂ්පාදනය සලකන්න.

(i) රූටයිල් මගින් $TiO_2$ නිපදවන ක්‍රියාවලිය නම් කරන්න.

(ii) ඉහත ක්‍රියාවලියට අවශ්‍ය වන අමුද්‍රව්‍ය (රූටයිල් හැර) නම් කරන්න.

(iii) ඉහත ක්‍රියාවලිය හා සම්බන්ධ ප්‍රධාන පියවර **දෙක** නම් කරන්න.

(iv) ඉහත එක් එක් පියවර යටතේ සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ දෙන්න.

(v) ඉහත ක්‍රියාවලිය ගෝලීය උණුසුම ඉහළ යෑමට දායක වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 50 යි)

(*b*) විවිධ පාරිසරික ගැටලු සඳහා දායකවන දූෂක අතර NO, $NO_2$, $SO_2$, $CH_4$, $CF_2Cl_2$ සහ $CF_2HCl$ ඇත. හැලජනීකෘත සංයෝග දෙක හැරුණු විට අනෙක්වා ස්වාභාවික ක්‍රියාවලි හා මිනිස් ක්‍රියාකාරකම් යන දෙකෙන්ම පරිසරයට නිකුත් වේ.

(i) NO නිදහස් කරනු ලබන ස්වාභාවික ක්‍රියාවලි හා මිනිස් ක්‍රියාකාරකම් **දෙක බැගින්** සඳහන් කරන්න.

(ii) අම්ල වැස්ස, ගෝලීය උණුසුම ඉහළ යෑම, ඕසෝන් වියන හායනය සහ ප්‍රකාශ රසායනික ධූමිකාව ප්‍රධාන වායුගෝලීය ගැටලු හතරක් වේ. මෙම එක් එක් සංසිද්ධිය කෙටියෙන් විස්තර කර එම එක එකක් සඳහා **සැලකිය යුතු දායකත්වයක්** දක්වන වායු **දෙක** බැගින් ඉහත ලැයිස්තුවෙන් හඳුනාගන්න.

(iii) ඕසෝන් වියන ආරක්ෂා කරගැනීමට දරන උත්සාහයක් ලෙස $CF_2Cl_2$ වලට විකල්පයක් ලෙස $CF_2HCl$ හඳුන්වාදෙන ලද්දේ මන්දැයි පැහැදිලි කරන්න.

(iv) සල්ෆර් අඩංගු ගල් අඟුරු ඉන්ධනයක් ලෙස භාවිත කරන කර්මාන්ත කලාපයක් ආශ්‍රිත ජලාශවල මත්ස්‍යයන් මිය යන බව වාර්තා වී ඇත. මෙම පාරිසරික ගැටලුව පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රමයක් හේතු දක්වමින් යෝජනා කරන්න.

(ලකුණු 50 යි)



Scanned with CamScanner

(*c*) (i) I. බහුඅවයවීකරණ ක්‍රියාවලියේදී සිදුවන ප්‍රතික්‍රියා වර්ගය අනුව බහුඅවයවකවල වර්ගීකරණය දෙන්න.

II. ඉහත (I) හි ඔබ සඳහන් කළ එක් එක් බහුඅවයවක වර්ගය සඳහා ව්‍යුහ **දෙක** බැගින් අඳින්න.

(ii) I. ස්වාභාවික රබර්වල පුනරාවර්තී ඒකකයේ ව්‍යුහය අඳින්න.

II. ස්වාභාවික රබර්හි ප්‍රත්‍යස්ථ ගුණය වෙනස් කිරීමට යොදාගන්නා ක්‍රියාවලිය නම් කර එය සඳහා යොදාගන්නා ද්‍රව්‍යයේ නම ලියන්න.

(iii) I. ට්‍රයිග්ලිසරයිඩයක් සහ මෙතනෝල් භාවිත කරමින් ජෛව ඩීසල් සංශ්ලේෂණය කිරීම පෙන්නුම් කිරීම සඳහා තුලිත රසායනික සමීකරණයක් දෙන්න.

II. ජෛව ඩීසල් නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රතික්‍රියා වර්ගයට දී ඇති නම ලියන්න.

III. $CH_3(GH_2)_{12}COOH$ හි ට්‍රයිග්ලිසරයිඩයේ 7.22 g කින් නිපදවෙන ජෛව ඩීසල්වල ස්කන්ධය ගණනය කරන්න.
(H = 1, C = 12, O = 16)

**(ලකුණු 50 යි)**

* * *

AL අපි | @AL_api



Scanned with CamScanner

## ලකුණු දීමේ පටිපාටිය/ Marking Scheme

### I පත්‍රය/ Paper I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 5 | 21. | 4 | 31. | 4 | 41. | 3 |
| 02. | 4 | 12. | 5 | 22. | 1 | 32. | 2 | 42. | 1 |
| 03. | 1 | 13. | 4 | 23. | 3 | 33. | 5 | 43. | 4 |
| 04. | 1 | 14. | 5 | 24. | 5 | 34. | 1 | 44. | 1 |
| 05. | 2 | 15. | 4 | 25. | 5 | 35. | 2 | 45. | 4 |
| 06. | 3 | 16. | 1 | 26. | 5 | 36. | 5 | 46. | 3 |
| 07. | 5 | 17. | 3 | 27. | 2 | 37. | 5 | 47. | 2 |
| 08. | 2 | 18. | 4 | 28. | 3 | 38. | All | 48. | 1 |
| 09. | 5 | 19. | 4 | 29. | 2 | 39. | 1 | 49. | 3 |
| 10. | 5 | 20. | 4 | 30. | 2 | 40. | 3 | 50. | 3 |

AL අපි | @AL_api

Scanned with CamScanner

## A කොටස - ව්‍යුහගත රචනා

ප්‍රශ්න හතරටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

1. (a) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද නැතහොත් අසත්‍ය ද යන බව තිත් ඉරි මත සඳහන් කරන්න. හේතු අවශ්‍ය නැත.

(i) දෙන ලද උපකවචයක ඉලෙක්ට්‍රෝන යුගල් වීම, එම උපකවචයේ සියලුම කාක්ෂිකවල ඉලෙක්ට්‍රෝන සමාන්තර බැමුම් සහිතව, තනි තනිව පිරෙන තෙක්, සිදු නොවේ. ....සත්‍ය....

(ii) ක්වොන්ටම් අංක $n$ සහ $l$ මගින් හැඳින්වෙන පරමාණුක කාක්ෂික, (I) $n = 4$ $l = 1$ (II) $n = 4$ $l = 0$ (III) $n = 3$ $l = 2$, ශක්තීන් වැඩි වන පිළිවෙළට (III) < (II) < (I) ලෙස තැබිය හැක. ....අසත්‍ය....

(iii) $SOF_4$ අණුවේ ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය සමචතුරස්‍ර පිරමිඩාකාර වේ. ....අසත්‍ය....

(iv) Li හි දෙවන අයනීකරණ ශක්තිය Be හි එම අගයට වඩා අඩු ය. ....අසත්‍ය....

(v) ෆ්ලුවොරීන්හි ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ ශක්තිය සෘණ අගයකි. ....සත්‍ය....

(vi) Be, C, Si සහ S යන පරමාණුවල පරමාණුක අරයයන් C < Be < S < Si යන පිළිවෙළට වැඩි වේ. ....අසත්‍ය....

(vii) $CH_3NH_2$ හි තාපාංකය $CH_3F$ හි එම අගයට වඩා වැඩි ය. ....සත්‍ය....

(viii) $Al^{3+}$, $O^{2-}$, $F^-$ සහ $S^{2-}$ හි අයනික අරයයන් $S^{2-} > F^- > O^{2-} > Al^{3+}$ යන පිළිවෙළට අඩු වේ. ....අසත්‍ය....

**(04 x 8 = ලකුණු 32)**

**1(a): ලකුණු 32**

(b) (i) $ClSO_2F$ අණුව සඳහා **වඩාත්ම** පිළිගත හැකි ලුවිස් තිත්-ඉරි ව්‍යුහය අඳින්න.




**(ලකුණු 06)**

(ii) ඉහත (i) හි අඳින ලද ව්‍යුහයේ S වල ඔක්සිකරණ අවස්ථාව දෙන්න.

S ....+6 or +VI....

ඉහත (i) හි ලුවිස් ව්‍යුහය නිවැරදි නම් පමණක් (ii) සඳහා ලකුණු ලබා දෙන්න.

**(ලකුණු 02)**



Scanned with CamScanner

(iii) $HN_2O_2^-$ අයනය සඳහා ස්ථායී ලුවිස් තිත්-ඉරි ව්‍යුහයක් පහත දක්වා ඇත. මෙම අයනය සඳහා තවත් ලුවිස් තිත්-ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) **දෙකක්** අඳින්න. දී ඇති ව්‍යුහයට සාපේක්ෂව ඔබ විසින් අඳින ලද එක් එක් ව්‍යුහයෙහි ස්ථායීතාවය දැක්වීමට **ස්ථායී**, **අස්ථායී** හෝ **අඩු ස්ථායී** ලෙස ව්‍යුහය යටින් ලියා දක්වන්න.





අඩු ස්ථායී      අඩු ස්ථායී

**(ව්‍යුහය ලකුණු 02) + (ස්ථායීතාවය ලකුණු 01)**

**(ලකුණු 06)**

(iv) පහත සඳහන් ලුවිස් තිත්-ඉරි ව්‍යුහය සහ එහි ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.



F—N¹—N²—N³—N⁴—H

| | | $N^1$ | $N^2$ | $N^3$ | $N^4$ |
|---|---|---|---|---|---|
| I. | පරමාණුව වටා VSEPR යුගල් සංඛ්‍යාව | 3 | 2 | 3 | 4 |
| II. | පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | තලීය ත්‍රිකෝණාකාර | රේඛීය | තලීය ත්‍රිකෝණාකාර | චතුස්තලීය |
| III. | පරමාණුව වටා හැඩය | කෝණික/ V හැඩය | රේඛීය | කෝණික/ V හැඩය | කෝණික/ V හැඩය |
| IV. | පරමාණුවේ මුහුම්කරණය | $sp^2$ | sp | $sp^2$ | $sp^3$ |

**(01 x 16 = ලකුණු 16)**

- කොටස් (v) සිට (viii), ඉහත (iv) කොටසෙහි දෙන ලද ලුවිස් තිත්-ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iv) කොටසෙහි ආකාරයටම වේ.

(v) පහත දැක්වෙන පරමාණු දෙක අතර σ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක/මුහුම් කාක්ෂික හඳුනාගන්න.

| | | | |
|---|---|---|---|
| I. | $N^1 — F$ | $N^1$ ....$sp^2$.... | F ....2p or $sp^3$.... |
| II. | $N^1 — N^2$ | $N^1$ ....$sp^2$.... | $N^2$ ....sp.... |
| III. | $N^2 — N^3$ | $N^2$ ....sp.... | $N^3$ ....$sp^2$.... |
| IV. | $N^3 — N^4$ | $N^3$ ....$sp^2$.... | $N^4$ ....$sp^3$.... |
| V. | $N^4 — H$ | $N^4$ ....$sp^3$.... | H ....1s.... |

**(01 x 10 = ලකුණු 10)**

(vi) පහත දැක්වෙන පරමාණු දෙක අතර π බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න.

I. $N^1 — N^2$   $N^1$ ...2p...   $N^2$ ...2p...

II. $N^2 — N^3$   $N^2$ ...2p...   $N^3$ ...2p...

**(01 x 4 = ලකුණු 4)**

(vii) $N^1$, $N^2$, $N^3$ සහ $N^4$ පරමාණු වටා බන්ධන කෝණවල ආසන්න අගයන් සඳහන් කරන්න.

$N^1$ ...$118^\circ \pm 1$...,  $N^2$ ...$180^\circ \pm 1$...,  $N^3$ ...$118^\circ \pm 2$...,  $N^4$ ...$104^\circ \pm 1$...

**(01 x 4 = ලකුණු 4)**

(viii) $N^1$, $N^2$, $N^3$ සහ $N^4$ පරමාණු ඒවායේ විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙළට සකසන්න.

...$N^4$... < ...$N^3$... < ...$N^1$... < ...$N^2$...

**(ලකුණු 4)**

**1(b): ලකුණු 52**

(c) (i) පහත දැක්වෙනුයේ තුන්වන ආවර්තයට අයත් වන මූලද්‍රව්‍යයක ප්‍රථම අයනීකරණ ශක්තියේ ($IE_1$) සිට අනුයාත අයනීකරණ ශක්තීන් හය, $IE_1$–$IE_6$ (kJ/mol වලින්) වේ.

| $IE_1$ | $IE_2$ | $IE_3$ | $IE_4$ | $IE_5$ | $IE_6$ |
|---|---|---|---|---|---|
| 1012 | 1903 | 2910 | 4956 | 6248 | 22230 |

මූලද්‍රව්‍යය හඳුනාගෙන, එහි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

I. මූලද්‍රව්‍යය : ...P... (2)

II. ඉලෙක්ට්‍රෝන වින්‍යාසය : ...$1s^2\ 2s^2\ 2p^6\ 3s^2\ 3p^3$... (2)

(ii) $AX_5$ යන සූත්‍රය ඇති අණුවක A—X σ බන්ධන පහක් ඇත. මෙහි A සහ X මූලද්‍රව්‍යවල සංකේත නිරූපණය කරන අතර A මධ්‍ය පරමාණුව වේ.
තිබිය හැකි අණුක හැඩය නම් කරමින් සහ එක් එක් හැඩයට උදාහරණයක් දෙමින් (අණුක සූත්‍ර අවශ්‍ය වේ) පහත වගුව සම්පූර්ණ කරන්න.

| | අණුක හැඩය | උදාහරණය |
|---|---|---|
| I. $AX_5$ ධ්‍රැවීය නම් | සමචතුරස්‍ර පිරමීඩය | $BrF_5/ClF_5/IF_5$ |
| II. $AX_5$ නිර්ධ්‍රැවීය නම් | ත්‍රිආනති ද්වි පිරමීඩය | $PCl_5/PF_5$ |

**(03 x 4 = ලකුණු 12)**

**1(c): ලකුණු 16**



Scanned with CamScanner

**2.** (*a*) (i) **A** ජලයෙහි ද්‍රාව්‍ය සුදු පැහැති සංයෝගයකි. එය 4:2:3 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය තුනකින් (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට) සමන්විත වේ. එක් එක් මූලද්‍රව්‍යයෙහි පරමාණුක ක්‍රමාංකය 20 ට වඩා අඩු වේ. මින් මූලද්‍රව්‍ය දෙකක් ආවර්තිතා වගුවේ *p*-ගොනුවට අයත් වේ. **A** රත් කිරීමේදී, එක් ඵලයක් ලෙස, අවර්ණ, විෂ නොවන, උදාසීන, රේඛීය ව්‍යුහයක් ඇති ත්‍රිපරමාණුක වායුවක් පිටවේ. **A** පොහොරක් වශයෙන් භාවිත වේ.

**A** හඳුනාගන්න. $NH_4NO_3$

(ii) **B** ද ජලයෙහි ද්‍රාව්‍ය සුදු පැහැති සංයෝගයකි. එය **A** හි මූලද්‍රව්‍ය තුනෙන්ම සමන්විත වේ. මෙම මූලද්‍රව්‍ය 4:2:2 අනුපාතයෙන් ඇත (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට). **B** රත් කිරීමේදී, අවර්ණ, ගන්ධයක් නොමැති, අධික බන්ධන විඝටන ශක්තියක් ඇති සම ද්විපරමාණුක වායුවක් පිටවේ. මෙම වායුව, කාර්මිකව, ද්‍රව වාතය භාගික ආසවනයෙන් ලබා ගනු ලැබේ.

**B** හඳුනාගන්න. $NH_4NO_2$

(iii) **C** සුදු පැහැති අයනික සංයෝගයකි. එය 8:2:4:1 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය හතරකින් (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට) සමන්විත වේ. එක් එක් මූලද්‍රව්‍යයෙහි පරමාණුක ක්‍රමාංකය 20 ට වඩා අඩු වේ. මින් මූලද්‍රව්‍ය තුනක් **A** හා **B** යන දෙකෙහිම අඩංගු වේ. **C** රත් කිරීමේදී, ප්‍රබල ගන්ධයක් ඇති, අවර්ණ, භාස්මික **X** වායුව සහ ප්‍රබල අම්ලයක් සෑදේ. **C** හි ජලීය ද්‍රාවණයකට $BaCl_2(aq)$ එක් කළ විට, තනුක HCl හි අද්‍රාව්‍ය සුදු පැහැති අවක්ෂේපයක් ලැබේ.

**C** හඳුනාගන්න. $(NH_4)_2SO_4$

(iv) **D** සුදු පැහැති අයනික සංයෝගයකි. එය 8:1:2:3 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය හතරකින් (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට) සමන්විත වේ. මින් මූලද්‍රව්‍ය තුනක් **A, B** හා **C** සංයෝග තුනෙහිම අඩංගු වේ. **D** රත් කිරීමේදී, ලැබෙන ඵලවලින් දෙකක් ලෙස, **X** වායුව සහ හුනු දියර කිරිපැහැ ගන්වන තවත් වායුවක් ලැබේ.

**D** හඳුනාගන්න. $(NH_4)_2CO_3$

(v) **E** ප්‍රබල අම්ලයකි. එය **A** හා **B** හි මූලද්‍රව්‍යවලින්ම සමන්විත වේ. ඒවා 3:1:1 අනුපාතයෙන් ඇත (පරමාණුක ස්කන්ධය වැඩිවන පිළිවෙළට **නොවේ**). **E** ප්‍රබල ඔක්සිකාරකයකි. **E** නිෂ්පාදනය සඳහා **X** භාවිත වේ.

**E** හඳුනාගන්න. $HNO_3$

**(2(a) 08 x 5 = ලකුණු 40)**

(*b*) ඉහත (*a*) හිදී හඳුනාගත් **A, B, C** හා **D** රත් කිරීමේදී සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

**A** $NH_4NO_3(s) \xrightarrow{\Delta} N_2O(g) + 2H_2O(g)$

**B** $NH_4NO_2(s) \xrightarrow{\Delta} N_2(g) + 2H_2O(g)$

**C** $(NH_4)_2SO_4(s) \xrightarrow{\Delta} 2NH_3(g) + H_2SO_4(g)$

**D** $(NH_4)_2CO_3(s) \xrightarrow{\Delta} 2NH_3(g) + CO_2(g) + H_2O(g)$

**(2(b) 08 x 4 = ලකුණු 32)**

**භෞතික තත්ත්ව අවශ්‍ය නැත. $\Delta$ අවශ්‍ය නැත.**



Scanned with CamScanner

(c) (i) ඉහත (a) කොටසේ පිළිතුරු මත පදනම්ව X හඳුනාගන්න. (4)

$X = NH_3$

(ii) X භාවිත කොට, ඉහත (a)(v) කොටසේදී හඳුනාගත් E නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය නම් කරන්න.

ඔස්වල්ඩ් ක්‍රියාවලිය (4)

(iii) ඉහත ක්‍රියාවලිය සඳහා භාවිත කරන අනෙක් අමුද්‍රව්‍යය/අමුද්‍රව්‍ය සඳහන් කරන්න.

$O_2$ (වාතය) + $H_2O$ ~~(4)~~ (2 + 2)

(iv) I. වැඩිපුර $Cl_2(g)$ සමග X ප්‍රතික්‍රියා කළ විට එක් ඵලයක් ලෙස Y සංයෝගය සෑදේ. එමෙ ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

$3Cl_2(g) + NH_3(g) \longrightarrow 3HCl(g) + NCl_3(l)$ (4)

II. Y ජලය සමග ප්‍රතික්‍රියා කළ විට ජලය විෂබීජහරණය (disinfect) සඳහා භාවිත කළ හැකි සංයෝගයක් සෑදේ. Y ජලය සමග ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

$NCl_3(l) + 3H_2O \longrightarrow NH_3(g) + 3HOCl(aq)$ (4)

(v) X හඳුනාගැනීම සඳහා **එක්** රසායනික පරීක්ෂණයක්, නිරීක්ෂණය සමග දෙන්න.

පරීක්ෂණය : පරීක්ෂාව - X, සාන්ද්‍ර HCl සමග ප්‍රතික්‍රියා කරවීම

නිරීක්ෂණය : නිරීක්ෂණය - සුදු දුමාරයක් සෑදීම (4 + 4)

හෝ

පරීක්ෂාව - X, නෙස්ලර් ප්‍රතිකාරය තුළට බුබුළනය කිරීම

නිරීක්ෂණය - දුඹුරු අවක්ෂේපණය හෝ වර්ණය

**(2(c) ලකුණු 28)**

**සටහන : භෞතික අවස්ථා සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.**

**සමතුලිතතා සංකේතය $\rightleftharpoons$ සියළු ප්‍රතික්‍රියා සඳහා අවශ්‍ය වේ.**

3. (a) HX(aq) යනු 25 °C දී $pK_a = 4$ වන දුබල අම්ලයකි.

(i) ජලීය ද්‍රාවණයකදී HX(aq) හි අයනීකරණය සඳහා සමීකරණය ලියන්න.

$$HX(aq) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + X^-(aq)$$

හෝ

$$HX(aq) \rightleftharpoons H^+(aq) + X^-(aq)$$

(5)



ALඅපි | ALapiedu.com

Scanned with CamScanner

(ii) ඉහත (i) හි සමතුලිතතා නියතය සඳහා ප්‍රකාශනය ලියන්න.

$$K_a = \frac{[H_3O^+(aq)][X^-(aq)]}{[HX_3(aq)]}$$

හෝ

$$K_a = \frac{[H^1(aq)][X^-(aq)]}{[HX(aq)]}$$ **(05)**

(iii) උෂ්ණත්වය 25 °C දී, 0.01 mol dm$^{-3}$ HX(aq) ද්‍රාවණයක pH ගණනය කරන්න.

| | $HX(aq) + H_2O(l)$ | $\rightleftharpoons H_3O^+(aq)$ | $+ X^-(aq)$ | |
|---|---|---|---|---|
| ආරම්භක සාන්ද්‍රණ | 0.01 | 0 | 0 | mol dm$^{-3}$ |
| සාන්ද්‍රණ වෙනස | $-x$ | $x$ | $x$ | mol dm$^{-3}$ |
| සමතුලිත සාන්ද්‍රණ | $0.01 - x$ | $x$ | $x$ | mol dm$^{-3}$ |

**(02+01)**

$$K_a = 1.0 \times 10^{-4} = \frac{x.x}{0.01-x} \approx \frac{x^2}{0.01}$$ **(02+02+02)**

$$x^2 = 1.0 \times 10^{-6}$$
$$x = [H_3O^+(aq)] = 1.0 \times 10^{-3}\ mol\ dm^{-3}$$ **(02+01)***

$$pH = -\log[H_3O^+(aq)] = 3$$ **(05)***

* ඉහත පියවර එකතු කළ හැක.

**විකල්ප පිළිතුර**　　　　(steps can be combine)

Ka = ප්‍රතිලඝු [$-pK_a$] = ප්‍රතිලඝු -4
= 1 x 10$^{-4}$ mol dm$^{-3}$ **(02)**

$$HX(aq) + H_2O(l) \rightleftharpoons H_3O^+(aq) + X^-(aq)$$

ආරම්භක සාන්ද්‍රණ　C(1-α)　　　Cα　　　Cα　　mol dm$^{-3}$ **(03)**

$$[H^+_{(aq)}]^2 = K_a \times [HX_{aq}] \qquad [H^+_{(aq)}] = \sqrt{K_a \times [HX_{aq}]}$$ **(02)**

$$[H^+_{(aq)}] = \sqrt{1 \times 10^{-4} \times 0.01}$$ **(02)**

$$[H^+_{(aq)}] = 1 \times 10^{-3}\ mol\ dm^{-3}$$ **(02+01)**

$$pH = -\log[H_3O^+(aq)] = -\log\ 1 \times 10^{-3} = 3$$ **(05)**



Scanned with CamScanner

(iv) උෂ්ණත්වය 25 °C දී 0.02 mol $dm^{-3}$ NaOH(aq) ද්‍රාවණයකින් 10.00 $cm^3$ පරිමාවක් 0.01 mol $dm^{-3}$ HX(aq) ද්‍රාවණයේ 25.00 $cm^3$ කට එකතු කරන ලදී.

I. ලැබෙන ද්‍රාවණයෙහි පවතින රසායනික විශේෂ ලියන්න.

$HX(aq),\ H_3O^+(aq), X^-(aq), OH^-(aq), Na^+(aq)\ and\ (H_2O(l))$ **(1 x 05)**

(NaX wrong)

II. මෙම වර්ගයේ ද්‍රාවණ පොදුවේ හඳුන්වනු ලබන්නේ කුමක් ලෙස ද?

ස්වාරක්ෂක ද්‍රාවණය **(03)**

III. මෙම ද්‍රාවණයෙහි pH ගණනය කිරීම සඳහා ප්‍රකාශනය ලියන්න.

$$pH = pK_a + log\left(\frac{[X^-(aq)]}{[HX(aq)]}\right) = \frac{[salt]}{[acid]}$$ **(05)**

IV. මෙම ද්‍රාවණයෙහි pH ගණනය කරන්න (1–10 සඳහා ලඝු අගයන් පහත දී ඇත).

| සංඛ්‍යාව | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලඝු අගය | 0.00 | 0.30 | 0.48 | 0.60 | 0.70 | 0.78 | 0.85 | 0.90 | 0.95 | 1.00 |

$HX(aq) + NaOH(aq) \rightarrow NaX(aq) + H_2O(l)$ **(03)**

හෝ

$HX(aq) + OH^-(aq) \rightarrow X^-(aq) + H_2O(l)$

| | HX(aq) | $OH^-(aq)$ | $X^-(aq)$ | |
|---|---|---|---|---|
| ආරම්භක මවුල | $0.01 \times 25 \times 10^{-3}$ | $0.02 \times 10 \times 10^{-3}$ | | |
| ඉතිරි මවුල | $(0.01 \times 25 \times 10^{-3} - 0.02 \times 10 \times 10^{-3})$ | 0 | $0.02 \times 10 \times 10^{-3}$ | **(02)** |
| සාන්ද්‍රණය(mol $dm^{-3}$) | *0.05/35* | | *0.20/35* | **(01+01+01)** |

*Substituting in* $pH = pK_a + log\left(\frac{[X^-(aq)]}{[HX(aq)]}\right)$

$$pH = 4 + log\left(\frac{0.20/35}{0.05/35}\right) = 4 + log(4) = 4 + 0.6 = 4.6$$ **(03+02)**

**Ka ප්‍රකාශනය භාවිතයෙන් ගණනය සිදු කළ ද, ලකුණු ප්‍රදානය කරන්න.**

AL ඇපි | ALapiedu.com



Scanned with CamScanner

V. pH = 4.00 ද්‍රාවණයක් ලබාගැනීම සඳහා 0.01 mol dm$^{-3}$ HX(aq) ද්‍රාවණයක 100.00 cm$^3$ සමග මිශ්‍ර කිරීමට අවශ්‍ය 0.02 mol dm$^{-3}$ NaOH(aq) ද්‍රාවණයක පරිමාව ගණනය කරන්න.

අවශ්‍ය 0.02 mol dm$^{-3}$ NaOH පරිමාව : V cm$^3$

pH = 4 මගින් $4 = 4 + log\left(\frac{[X^-(aq)]}{[HX(aq)]}\right)$

$log\left(\frac{[X^-(aq)]}{[HX(aq)]}\right) = 0$ ; $\frac{[X^-(aq)]}{[HX(aq)]} = 1$;  $[X^-(aq)] = [HX(aq)]$ **(04)**

$$[HX(aq)] = \frac{(0.01\times100\times10^{-3} - 0.02\times V\times10^{-3})}{(100+V)\times10^{-3}}\ \text{mol dm}^{-3}$$ **(02+01)**

$$[X^-(aq)] = \frac{(0.02\times V\times10^{-3})}{(100+V)\times10^{-3}}\ \text{mol dm}^{-3}$$ **(02+01)**

$$\frac{(0.01\times100\times10^{-3} - 0.02\times V\times10^{-3})}{(100+V)\times10^{-3}} = \frac{(0.02\times V\times10^{-3})}{(100+V)\times10^{-3}}$$ **(02)**

$$(0.01\times100\times10^{-3} - 0.02\times V\times10^{-3}) = 0.02\times V\times10^{-3}$$
$$(1.0 - 0.02V) = 0.02V$$
$$V = 25\ cm^3$$

**(04+01)**

**විකල්ප පිළිතුර:**

pH = 4 = pK$_a$ **(05)**

මෙය අර්ධ සමකතා ලක්ෂ්‍යය හා සමාන වේ. **(03)**

NaOH හි සාන්ද්‍රණය හි සාන්ද්‍රණය HX මෙන් දෙගුණයක් වේ. **(03)**

සමකතා ලක්ෂ්‍යයේ දී HX පරිමාව, $NaOH$ පරිමාවෙන් අර්ධයක් වේ. **(03)**

එම නිසා අර්ධ සමකතා ලක්ෂ්‍යයේදී HX පරිමාව

$\frac{1}{4}\ volume\ of\ NaOH = 25\ cm^3$ **(03)**

**3(a) ලකුණු 70**

(*b*) 25 °C දී, MgF$_2$(s) ජලයෙහි මඳ වශයෙන් ද්‍රාව්‍ය වේ ($K_{sp} = 6.4\times10^{-9}$ mol$^3$ dm$^{-9}$). 0.20 mol dm$^{-3}$ NaF(aq) ද්‍රාවණයක 500.00 cm$^3$ හි සම්පූර්ණයෙන්ම ද්‍රාව්‍ය වන උපරිම MgF$_2$(s) ස්කන්ධය ගණනය කරන්න. MgF$_2$(s) එකතු කිරීමෙන් ද්‍රාවණයෙහි පරිමාව වෙනස් නොවන බව උපකල්පනය කරන්න. (F = 19, Mg = 24)

$$MgF_2(s) \rightleftharpoons Mg^{2+}(aq) + 2F^-(aq)$$ **(04)**

$$K_{sp} = [Mg^{2+}(aq)][F^-(aq)]^2$$ **(04)**

පළමුව $NaF(aq)$ තුළ $MgF_2(s)$ ද්‍රාව්‍යතාවය ගණනය කළ යුතු වේ.

ද්‍රාවණතාවය *s* ලෙස සලකමින්,

$$MgF_2(s) \rightleftharpoons Mg^{2+}(aq) + 2F^-(aq)$$

| | | | | |
|---|---|---|---|---|
| ආරම්භක සාන්ද්‍රණ | 0 | 0 | 0.20 mol dm$^{-3}$ | |
| සාන්ද්‍රණ වෙනස | 0 | s | 2s | |
| සමතුලිත සාන්ද්‍රණ | | s | (2s + 0.20) mol dm$^{-3}$ | **(04+01)** |

$$K_{sp} = 6.4\times10^{-9} = s\,(0.20+2s)^2 \approx s(0.20)^2$$ **(02)**

$s = 1.6 \times 10^{-7}\ mol\ dm^{-3}$ (04+01)

NaF 500 $cm^3$ තුළ දිය කළ හැකි $MgF_2(s)$ මවුල සංඛ්‍යාව

$1.6 \times 10^{-7} \times 0.5 = 8.0 \times 10^{-8}\ mol$ (04+01)

$MgF_2(s)$ ස්කන්ධය $= 8.0 \times 10^{-8} \times 62 = 4.96 \times 10^{-6}\ g$ (04+01)

**3(b) ලකුණු 30**

AL අපි | ALapiedu.com



Scanned with CamScanner

4. (*a*) පහත දක්වා ඇති ප්‍රතික්‍රියා පටිපාටිය සලකන්න. එහි,

- A යනු අණුක සූත්‍රය $C_5H_{10}$ වූ හයිඩ්‍රොකාබනයකි.
- D හි අණුක සූත්‍රය $C_5H_{10}O_2$ වේ. එය ප්‍රකාශ සමාවයවිකතාවය දක්වයි. D ජලීය $Na_2CO_3$ සමඟ ප්‍රතික්‍රියා කළ විට, $CO_2$ මුක්ත වේ.
- J හි අණුක සූත්‍රය $C_5H_8$ වේ. J ඇමෝනීකෘත $AgNO_3$ සමඟ අවක්ෂේපයක් ලබා දේ.




(i) A, B, C, D, E, F, G සහ J හි ව්‍යුහයන් අදාළ කොටු තුළ අඳින්න.



A



B



C



D



E



F



G



J

–OH වෙනුවට –HO ලෙස වැරදි

ලකුණු 06 × 8 = 48

AL අපි | AL.apiedu.com

- $HgSO_4$/ තනුක $H_2SO_4$ සමග **J** ප්‍රතික්‍රියා කළ විට **K** සෑදේ. **K** එක් (01) පියවරකින් **G** බවට පරිවර්තනය කළ හැක.

  (ii) අදාළ කොටු තුළ **K** හි ව්‍යුහය ඇඳ **K, G** බවට පරිවර්තනය කිරීම සඳහා භාවිත කළ හැකි ප්‍රතිකාරක/ය දෙන්න.



**K**

**K**

Zn(Hg)/Conc. HCl

ප්‍රතිකාරක/ය

**06 × 2 = ලකුණු 12**

**4(a) ලකුණු 60**

(*b*) පහත දක්වා ඇති ප්‍රතික්‍රියා සඳහා ප්‍රතික්‍රියා වර්ගය [නියුක්ලියෝෆිලික ආකලනය ($A_N$), ඉලෙක්ට්‍රොෆිලික ආකලනය ($A_E$), නියුක්ලියෝෆිලික ආදේශය ($S_N$), ඉලෙක්ට්‍රොෆිලික ආදේශය ($S_E$), ඉවත් කිරීම (E)] සහ ප්‍රධාන ඵලය වගුවෙහි අදාළ කොටු තුළ ලියන්න.

| | ප්‍රතික්‍රියාව | ප්‍රතික්‍රියා වර්ගය | ප්‍රධාන ඵලය |
|---|---|---|---|
| (i) |  $\xrightarrow{Br_2}$ | $A_E$ |  |
| (ii) |  $\xrightarrow[\text{තාපය}]{\text{නිර්ජලීය } Al_2O_3}$ | E | $CH_3CH{=}CHCH_2CH_3$ |
| (iii) | $CH_3CH_2CH_2OH \xrightarrow{HBr}$ | $S_N$ | $CH_3CH_2CH_2Br$ |

independant marks →

**03 × 6 = ලකුණු 18**

**4(b) ලකුණු 18**

insted of $-CH_2CH_3$, $-C_2H_5$ accept
but $-C_3H_7$ not accept because
it has isomers

AL ඇපි | ALapiedu.com



Scanned with CamScanner

(*c*) පහත දී ඇති ප්‍රතික්‍රියාවෙහි ප්‍රධාන ඵලය **L** හි ව්‍යුහය අඳින්න. මෙම ප්‍රතික්‍රියාවෙහි යාන්ත්‍රණය ලියන්න.




**L**

**යාන්ත්‍රණය:**




**4(c) ලකුණු 22**

AL අපි | ALapiedu.com

## B කොටස — රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට ලකුණු 150 බැගින් ලැබේ.)

**සටහන : භෞතික තත්ව අනාවශ්‍ය වේ.**

5. (a) $N_2(g)$ හි 1.0 mol ක් සහ $H_2(g)$ හි 2.0 mol ක් කලින් රික්තනය කරන ලද පරිමාව 1.0 $dm^3$ වන දෘඪ-සංවෘත භාජනයක් තුළ 450 °C උෂ්ණත්වයේදී මිශ්‍ර කර පහත සමතුලිතතාවයට එළඹීමට ඉඩ හරින ලදී.

$$N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g)$$

සමතුලිතතාවයේදී $NH_3(g)$ හි 1.0 mol ක් ඇති බව සොයාගන්නා ලදී.

(i) 450 °C දී සමතුලිතතා පද්ධතියෙහි මුළු පීඩනය ගණනය කරන්න (450 °C දී $RT = 6 \times 10^3$ J $mol^{-1}$).

$$N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g)$$

| | | | | | |
|---|---|---|---|---|---|
| *ආරම්භක සාන්ද්‍ර* | *1.0* | *2.0* | *0* | *mol dm⁻³* | |
| *සාන්ද්‍රණයේ වෙනස* | *-x* | *-3x* | *2x* | *mol dm⁻³* | |
| *සමතුලිත සාන්ද්‍ර* | *1 – x* | *2-3x* | *1.0* | *mol dm⁻³* | (04+01) |

සමතුලිත අවස්ථාවේදී $NH_3(g)$ 1.0 මවුල ඇත.

∴ $NH_3(g)$: හි සමතුලිත සාන්ද්‍රණ $2x = 1$: $x = 0.5$ *mol dm⁻³* (01+01)

∴ මිශ්‍රණයේ සමතුලිත සාන්ද්‍රණය *0.5  0.5  1.0  mol dm⁻³* (02+01)

සමතුලිත අවස්ථාවේ මිශ්‍රණයේ ඇති මුළු මවුල = 2 mol

වායුවල පරිපූර්ණ හැසිරීම උපකල්පනය කරමින්: PV = nRT (03)

$$P = \frac{nRT}{V} = \frac{2\ mol \times (6\times10^3\ J\ mol^{-1})}{1.0\times10^{-3} m^3} = 1.20 \times 10^7\ Pa$$ (04+01)

(ii) 450 °C දී සමතුලිතතා පද්ධතියේ $N_2(g)$, $H_2(g)$ සහ $NH_3(g)$ හි ආංශික පීඩන ගණනය කරන්න.

$P_i = X_i P$ භාවිතයෙන්, (02)

$$P_{N_{2(g)}} = \frac{0.5}{2} \times 1.20 \times 10^7\ Pa = 3.0 \times 10^6\ Pa$$ (03+01)

$$P_{H_{2(g)}} = \frac{0.5}{2} \times 1.20 \times 10^7\ Pa = 3.0 \times 10^6\ Pa$$ (03+01)

$$P_{NH_{3(g)}} = \frac{1.0}{2} \times 1.20 \times 10^7\ Pa = 6.0 \times 10^6\ Pa$$ (03+01)

(හෝ වායු තුන සඳහා PV = nRT භාවිතය)

(iii) 450 °C දී පද්ධතියෙහි සමතුලිතතා නියතය $K_p$ ගණනය කරන්න.

$$K_p = \frac{P^2_{NH_{3(g)}}}{P_{N_{2(g)}}\ P^3_{H_{2(g)}}} = \frac{(6.0\times10^6\ Pa)^2}{(3.0\times10^6\ Pa)\ (3.0\times10^6\ Pa)^3} = 4.40 \times 10^{-13}\ Pa^{-2}$$

(03+02+04+01)

expression  units

AL ඇපි | ALapiedu.com



Scanned with CamScanner

(iv) ඉහත (iii) හි ලබාගත් $K_p$ අගය භාවිතයෙන් 450 °C දී පද්ධතියෙහි සමතුලිතතා නියතය $K_C$ ගණනය කරන්න.

$K_P = K_C(RT)^{\Delta n}$ : $\Delta n = -2$ භාවිතයෙන්, (03+02)

$K_C = K_P(RT)^2 = 4.40 \times 10^{-13}\ Pa^{-2}\ (6 \times 10^3\ J\ mol^{-1})^2$ (03)

$K_C = 15.84\ mol^{-2}\ dm^6\ /\ 15.84 \times 10^{-6}\ mol^{-2}m^6$

$K_C = 16\ mol^{-2}\ dm^6$ හෝ $1.6 \times 10^{-5}\ mol^{-2}m^6$ (04+01)

(v) 450 °C දී ඉහත පද්ධතියට Ar(g) හි 1.0 mol ක් එකතු කළ විට $N_2(g)$, $H_2(g)$ සහ $NH_3(g)$ හි ආංශික පීඩන අගයන්හි හා $K_p$ අගයෙහි කිසියම් වෙනස්වීම් සිදු වන්නේ නම් ඒවා දක්වන්න (ගණනය කිරීම අවශ්‍ය නොවේ).

අංශික පීඩන සහ $K_p$ වෙනස් නොවේ. (03+02)

**5(a): ලකුණු 60**

(*b*) $N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g)$ ප්‍රතික්‍රියාවෙහි $\Delta H^\circ$ සහ $\Delta S^\circ$ උෂ්ණත්වය සමග වෙනස් නොවන බව උපකල්පනය කරන්න.

(i) පද්ධතියේ උෂ්ණත්වය වැඩි කළ විට $NH_3(g)$ හි සමතුලිත සාන්ද්‍රණය මත ඇතිවන බලපෑම පුරෝකථනය කරන්න.

$N_2(g) + 3H_2(g) \rightleftharpoons 2NH_3(g)$ වායුමය ප්‍රභේද සංඛ්‍යාව අඩුවන බැවින් ප්‍රතික්‍රියාවේ $\Delta S$ (- ve) වේ.

එමනිසා (-T$\Delta S$) ධන (+ ve) වේ. (05)

$\Delta G^\theta = \Delta H^\theta - T\Delta S^\theta$ සමීකරණය සැලකූ විට, (05)

උෂ්ණත්වය වැඩි වන විට T$\Delta S$ වැඩි වේ. -T$\Delta S$ ඉහළ උෂ්ණත්වයෙහි වඩාත් ධන වේ.

∴ ඉහළ උෂ්ණත්වයෙහි $\Delta G^\theta$ හි සෘණභාවය අඩු වේ හෝ ධන වේ. (05)

∴ ඉහළ උෂ්ණත්වයෙහි $NH_3(g)$ ඵලදාව අඩු වේ. (05)

**විකල්ප පිළිතුර 1**

ප්‍රතික්‍රියාව තාපදායක වේ. හෝ $\Delta H$ සෘණ වේ. (05)

**ලේ චැටලියර් මූලධර්මය අනුව (05) උෂ්ණත්වය වැඩිවන විට සමතුලිතය ආපස්සට යොමු වේ (05). එම නිසා $NH_3(g)$ ඵලදාව අඩු වේ (05).**

**විකල්ප පිළිතුර 2**

Qc ඇසුරෙන් පහදා දීමද පිළිගත හැක. (05 x 4)

AL අපි | ALapiedu.com



Scanned with CamScanner

(ii) ඉහත ප්‍රතික්‍රියාව සඳහා $\Delta H^{\circ} = -90\ kJ\ mol^{-1}$ සහ $\Delta S^{\circ} = -200\ J\ K^{-1}\ mol^{-1}$ වේ.
27 °C සහ 527 °C දී ප්‍රතික්‍රියාවෙහි $\Delta G^{\circ}$ අගයන් ගණනය කිරීමෙන් ඉහත (i) හි ඔබ සිදු කළ පුරෝකථනය නිවැරදි බව පෙන්වන්න.

$\Delta G^{\theta} = \Delta H^{\theta} - T\Delta S^{\theta}$ උෂ්ණත්වය දෙකකට යෙදීමෙන්

27 °C (300 K) and 527 °C (800 K)

$$\Delta G^{\theta}_{300\,K} = -90\ kJ\ mol^{-1} - 300\ K \times (-200\ K \times 10^{-3}\ kJ\ K^{-1}\ mol^{-1})$$

$$\Delta G^{\theta}_{300\,K} = -30\ kJ\ mol^{-1}$$ **(02+02+01)**

$$\Delta G^{\theta}_{800\,K} = -90\ kJ\ mol^{-1} - 800\ K \times (-200\ K \times 10^{-3}\ kJ\ K^{-1}\ mol^{-1})$$

$$\Delta G^{\theta}_{300\,K} = +70\ kJ\ mol^{-1}$$ **(02+02+01)**

∴ ඉහළ උෂ්ණත්වයෙහි $\Delta G^{\theta}$ ධන අගය වැඩි වේ. **(05)**

∴ (i) හි දැක්වූ පුරෝකථනය සත්‍ය වේ.

(මෙම කරුණු ප්‍රතිකියාව තාපදායක බව දක්වමින්, උෂ්ණත්වය වැඩි කිරීමේදී පසුපස ප්‍රතික්‍රියාව සිදුවේ යයි, යන පිළිතුරට **ලකුණු 05 ක් පමණක්** ප්‍රදානය කරන්න.)

(iii) 450 °C දී සංවෘත-දෘඪ භාජනය තුළ සිදුවෙමින් පවතින $2NH_3(g) \rightleftharpoons N_2(g) + 3H_2(g)$ ප්‍රතික්‍රියාව සලකන්න.

I. උෂ්ණත්වය වැඩි කිරීමේදී $\left(\dfrac{[NH_3(g)]^2}{[N_2(g)][H_2(g)]^3}\right)$ හි අගය මත ඇතිවන බලපෑම පුරෝකථනය කරන්න.

මෙම ප්‍රතික්‍රියාව තාප අවශෝෂක වේ. **(05)**
ඉදිරි ප්‍රතික්‍රියාව ඉහළ උෂ්ණත්වයේ දී හිතකර වේ.
∴ $\dfrac{[NH_{3(g)}]^2}{[N_{2(g)}]\ [H_{2(g)}]^3}$ අනුපාතය අඩු වේ. **(05)**

II. ඉහත ප්‍රතික්‍රියාව සඳහා 450 °C දී උත්ප්‍රේරකයක් ඇති විට සහ නොමැති විට සමතුලිතතාවයට එළඹීමට ගතවන කාලය පිළිබඳව අදහස් දක්වන්න.

උත්ප්‍රේරයක් ඇති විට සමතුලිතතාවට අවශ්‍ය කාලය අඩු වේ **(05)**. සමතුලිත නියතය වෙනස් නොවේ.

III. ඉහත II හි ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

උත්ප්‍රේරයක් ඇති විට ඉදිරි සහ පසු ප්‍රතික්‍රියා වේගවත් වේ **(03)**. ප්‍රතික්‍රියාව සක්‍රියන ශක්තිය **(03)** අඩු වන යාන්ත්‍රයක් ඔස්සේ සිදු වේ **(04)**.

| 5(b): 60 marks |
|---|

AL ඇති ALevel.com



Scanned with CamScanner

(c) (i) සංශුද්ධ ද්‍රවයක 'සාමාන්‍ය තාපාංකය' අර්ථ දක්වන්න.

සංශුද්ධ ද්‍රවයක සාමාන්‍ය තාපාංකය යනු 1 atm (100 kPa) පීඩනයේ දී ද්‍රවය එහි වාෂ්පය සමග සමතුලිතව ඇති විට හෝ 1 atm (100 kPa) හි දී නටන විට උෂ්ණත්වයයි. **(05)**

හෝ

ද්‍රවයේ සංතෘප්ත වාෂ්ප පීඩනය 1 atm (100 kPa) පීඩනයට සමාන වන උෂ්ණත්වයයි.

(ii) සංශුද්ධ $CCl_4(l)$ හි තාපාංකයේදී පවතින සමතුලිතතාවය ලියන්න.

$CCl_4(l) \rightleftharpoons CCl_4(g)$ හෝ $CCl_4(g) \rightleftharpoons CCl_4(l)$ **(05)**

(iii) $\Delta H^\circ_{CCl_4(g)} = -95\ kJ\ mol^{-1}$ , $\Delta H^\circ_{CCl_4(l)} = -128\ kJ\ mol^{-1}$
$\Delta S^\circ_{CCl_4(g)} = 309\ J\ K^{-1}\ mol^{-1}$ , $\Delta S^\circ_{CCl_4(l)} = 214\ J\ K^{-1}\ mol^{-1}$ ලෙස දී ඇත.
$CCl_4(l)$ හි සාමාන්‍ය තාපාංකය ගණනය කරන්න.

$\Delta H^\theta_{rxn} = -95 - (-128) = 33\ kJ\ mol^{-1}$ **(02+02+01)**

$\Delta S^\theta_{rxn} = 309 - 214 = 95\ J\ K^{-1}\ mol^{-1} = 95 \times 10^{-3}\ kJ\ K^{-1}\ mol^{-1}$ **(02+02+01)**

$\Delta G^\theta = \Delta H^\theta - T\Delta S^\theta$ භාවිතයෙන්,

සමතුලිත අවස්ථාවේ දී; $\Delta G^\theta = 0\ \therefore \Delta H^\theta - T_b\Delta S^\theta$; වේ. $T_b$ යනු තාපාංකයයි. **(05)**

$T_b = \frac{\Delta H^\theta}{\Delta S^\theta} = \frac{33\ kJ\ mol^{-1}}{95 \times 10^{-3}\ kJ\ K^{-1}\ mol^{-1}} = 347\ K = 74\ °C$ **(02+02+01)**

**5(c): 30 marks**

AL අපි | ALapiedu.com



Scanned with CamScanner

**සටහන : භෞතික තත්ව අත්‍යවශ්‍ය වේ.**

6. (a) 25 °C දී $2NO(g) + Cl_2(g) \rightarrow 2NOCl(g)$ ප්‍රතික්‍රියාව සලකන්න.

25 °C දී ඉහත ප්‍රතික්‍රියාව සඳහා සිදු කරන ලද ආරම්භක-වේග පරීක්ෂණයක ප්‍රතිඵල පහත දක්වා ඇත. $[NO(g)]_0$ සහ $[Cl_2(g)]_0$ යනු පිළිවෙළින් NO(g) හා $Cl_2(g)$ හි ආරම්භක සාන්ද්‍රණ වේ.

| පරීක්ෂණය | $[NO(g)]_0$/mol dm$^{-3}$ | $[Cl_2(g)]_0$/mol dm$^{-3}$ | $\frac{-\Delta[Cl_2(g)]}{\Delta t}$/mol dm$^{-3}$ s$^{-1}$ |
|---|---|---|---|
| 1 | 0.25 | 0.50 | 0.75 |
| 2 | 0.25 | 1.00 | 3.00 |
| 3 | 0.50 | 2.00 | 24.00 |

(i) ප්‍රතික්‍රියාව සඳහා සමීකරණයේ දැක්වෙන එක් එක් විශේෂයට අනුබද්ධව ප්‍රතික්‍රියාවේ වේගය සඳහා ප්‍රකාශන ලියන්න.

$2NO(g) + Cl_2(g) \rightleftharpoons 2NOCl(g)$

සීඝ්‍රතාව ; $\frac{-\Delta[NO(g)]}{2\Delta t}$ ; $\frac{-\Delta[Cl_2(g)]}{\Delta t}$ ; $\frac{\Delta[NOCl(g)]}{2\Delta t}$ **(02x3)**

(ii) NO(g) ට හා $Cl_2(g)$ ට සාපේක්ෂව ප්‍රතික්‍රියාවෙහි පෙළ පිළිවෙළින් a හා b සහ වේග නියතය $k$ වේ නම් ප්‍රතික්‍රියාව සඳහා වේග ප්‍රකාශනය/නියමය ලියන්න.

සීඝ්‍රතාව $= k[NO(g)]^a[Cl_2(g)]^b$ **(04)**

(iii) a හා b හි අගයයන් සහ ප්‍රතික්‍රියාවේ සම්පූර්ණ පෙළ ගණනය කරන්න.

පරීක්ෂණ 1 සහ 2 සඳහා ;

$k(0.25)^a(0.50)^b = 0.75$ (1) **(04)**

$k(0.25)^a(1.00)^b = 3.00$ (2) **(04)**

$\frac{(1)}{(2)}$ : $\frac{k(0.25)^a(0.50)^b}{k(0.25)^a(1.00)^b} = \frac{0.75}{3.00}$ **(04)**

$\frac{1}{4} = \left(\frac{1}{2}\right)^b$ ; $b = 2$ **(04)**

හෝ [NO(g)] නියත වේ. $[Cl_2(g)]$ දෙගුණ කළ විට, වේගය 4 ගුණයක් වේ.

එමනිසා පෙළ b = 2

පරීක්ෂණ 2 සහ 3 සඳහා ;

$k(0.50)^a(2.00)^b = 24.00$ (3) **(04)**

$k(0.25)^a(0.50)^b = 3.00$ (2)

$\frac{(3)}{(2)}$ : $\frac{k(0.50)^a(2.0)^b}{k(0.25)^a(1.00)^b} = \frac{24.00}{3.00} = 8$ **(04)**

$(2)^a(2)^2 = 8 = (2)^{(a+2)}$

$(a+2) = 3$ : $a = 1$ **(04)**

සමස්ත පෙළ $= (2 + 1) = 3$ **(04)**

AL අපි | ALapiedu.com



Scanned with CamScanner

(iv) 25 °C දී ප්‍රතික්‍රියාවෙහි වේග නියතය $k$ ගණනය කරන්න.

සීඝ්‍රතාව $= k[NO(g)][Cl_2(g)]^2$ **(04)**

1 පළමු පරීක්ෂණය සඳහා ;

$k(0.25)(0.50)^2 = 0.75$ **(04)**

$k = 12\ dm^6\ mol^{-2}\ s^{-1}$ **(04+01)**

(v) 25 °C දී NO(g) සහ $Cl_2(g)$ හි ආරම්භක සාන්ද්‍රණ පිළිවෙළින් 0.50 සහ 0.10 mol $dm^{-3}$ වන විට $Cl_2(g)$ වැයවන වේගය ගණනය කරන්න.

$Cl_2(g)$ වැයවීමේ සීඝ්‍රතාව $= \frac{-\Delta[Cl_2(g)]}{\Delta t}$

$= 12 \times (0.50)(0.10)^2 = 0.06\ mol\ dm^{-3}\ s^{-1}$ **(02+01)**

(vi) 25 °C දී $Cl_2(g)$ වැයවන වේගය 4.5 mol $dm^{-3}$ $s^{-1}$ වන විට 25 °C දී NOCl(g) සෑදෙන වේගය ගණනය කරන්න.

$NOCl(g)$ සෑදීමේ සීඝ්‍රතාව $= \frac{\Delta[NOCl(g)]}{\Delta t}$

මෙම ප්‍රතික්‍රියාවේ; 2 mol NOCl(g) ≡ $1\ mol\ Cl_2(g)$

$$\frac{\Delta[NOCl(g)]}{2\,\Delta t} = \frac{-\Delta[Cl_2(g)]}{\Delta t}$$

$$\frac{\Delta[NOCl(g)]}{\Delta t} = \frac{2\,\Delta[Cl_2(g)]}{\Delta t}$$ **(04)**

$= 2 \times 4.5 = 9.0\ mol\ dm^{-3}\ s^{-1}$ **(04+01)**

(vii) 25 °C දී NO(g) සහ $Cl_2(g)$ හි ආරම්භක සාන්ද්‍රණ පිළිවෙළින් 0.20 සහ 0.30 mol $dm^{-3}$ වන විට NOCl(g) සෑදෙන වේගය ගණනය කරන්න.

ප්‍රතික්‍රියාවේ වේගය $= 12 \times (0.20)(0.30)^2 = 0.216\ mol\ dm^{-3}\ s^{-1}$ **(02+01+01)**

$NOCl(g)$ සෑදීමේ වේගය $= 2 \times 0.216 = 0.432\ mol\ dm^{-3}\ s^{-1}$ **(02+01+01)**

**6(a): ලකුණු 75**

AL ඇපි | ALapiedu.com



Scanned with CamScanner

(*b*) Cu කුඩු නයිට්‍රික් අම්ලය සමග ප්‍රතික්‍රියාවේදී N සහ O අඩංගු රතු-දුඹුරු වායුවක් සෑදේ. 33 °C දී සිදු කළ පරීක්ෂණයකදී සෑදුන වායුව 150 $cm^3$ බඳුනක් තුළට එකතු කරගන්නා ලදී. වායුවෙහි පීඩනය සහ ස්කන්ධය පිළිවෙළින් 831.4 mm Hg සහ 0.300 g විය. සෑදුන වායුවෙහි මවුලික ස්කන්ධය ගණනය කර එහි රසායනික සූත්‍රය දෙන්න. යොදාගත් උපකල්පන/උපකල්පනය සඳහන් කරන්න. (1 mm Hg = 133.3 Pa, N = 14, O = 16)

වායුවක පරිපූර්ණ හැසිරීම සලකමින්; **(05)**

$PV = nRT = \frac{m}{M} RT$ **(05+05)**

$P = \frac{m}{VM} RT$ **(05)**

$M = \frac{d\,RT}{P}$ ; $d$: *density of the gas* $= \frac{0.30\ g\ dm^{-3}}{150\times10^{-3}} = 2\ g\ dm^{-3}$

$M = \frac{d\,RT}{P} = \frac{2.0\times10^{3}\ gm^{-3}\times 8.314\ J\,K^{-1}\,mol^{-1}\times 306\ K}{831.4\times133\ Pa} = 46\ g\ mol^{-1}$ **(05+05)**

(ආදේශය සඳහා 05 පිළිතුර සඳහා 05)

∴ වායුව $NO_2$ වේ. **(05)**

**6(b): ලකුණු 35**

(*c*) දී ඇති උෂ්ණත්වයකදී එක හා සමාන A හා B භාජන දෙකක් තුළ පිළිවෙළින් සංශුද්ධ ජලය සහ 3.0 mol $dm^{-3}$ ග්ලිසරෝල් ජලීය ද්‍රාවණ සමාන පරිමා අඩංගු වේ.

(i) A හා B වල අඩංගු දෑහි වාෂ්ප පීඩන

(ii) A හා B වල අඩංගු දෑහි තාපාංක

හේතු දක්වමින් සංසන්දනය කරන්න.

i. ද්‍රාවණයේ මතුපිට පෘෂ්ඨයේ සජල ග්ලිසරෝල් ඇති නිසා, **(05)** ග්ලිසරෝල් ද්‍රාවණයේ වාෂ්ප පීඩනය සංශුද්ධ ජලයට වඩා අඩු වේ. **(05)**

ii. ග්ලිසරෝල් ද්‍රාවණයේ වාෂ්ප පීඩනය අඩු බැවින්, එහි තාපාංකය සංශුද්ධ ජලයට වඩා වැඩි වේ. **(05)**

**6(c): ලකුණු 15**

(*d*) දී ඇති උෂ්ණත්වයකදී සංවෘත භාජනයක් තුළ C හා D ද්‍රව මිශ්‍ර කිරීමෙන් පරිපූර්ණ ද්වයංගී ද්‍රව මිශ්‍රණයක් සාදන ලදී. මෙම උෂ්ණත්වයේදී C හා D හි වාෂ්ප පීඩන පිළිවෙළින් $P_C$ සහ $P_D$ වන අතර C හා D හි සංතෘප්ත වාෂ්ප පීඩන පිළිවෙළින් $P_C^\circ$ සහ $P_D^\circ$ වේ. ද්‍රව කලාපයෙහි C සහ D හි මවුලභාගයන් පිළිවෙළින් $X_C$ සහ $X_D$ විය.

(i) මෙම උෂ්ණත්වයේදී C හි සාපේක්ෂ වාෂ්ප පීඩන-පාතනය සඳහා ප්‍රකාශනය ව්‍යුත්පන්න කරන්න.

රවුල් නියමයට අනුව $P_C = P_C^0 X_C$ **(05)**

ද්‍රාව්‍යයේ වාෂ්ප පීඩනයේ අඩුවීම (පාතනය) C $= P_C^0 - P_C = P_C^0 - P_C^0 X_C$ **(05)**

$= P_C^0(1 - X_C) = P_C^0(X_D)$

∴ සාපේක්ෂ වාෂ්ප පීඩන අඩුවීම (පාතනය) C $= \frac{P_C^0 - P_C}{P_C^0} = X_D$ **(05)**



AL අපි | ALapiedu.com

Scanned with CamScanner

(ii) 25 °C දී ජලය 900 g ක් තුළ ග්ලිසරෝල් 1.0 mol ක් දිය කිරීමෙන් ද්‍රාවණයක් සාදන ලදී. එහි

I. සාපේක්ෂ වාෂ්ප පීඩන-පාතනය (mm Hg)

II. වාෂ්ප පීඩනය (mm Hg)

ගණනය කරන්න.

25 °C දී ජලයෙහි සංතෘප්ත වාෂ්ප පීඩනය 24 mm Hg වේ. (H = 1, O = 16)

25 °C දී ග්ලිසරෝල්වල සංතෘප්ත වාෂ්ප පීඩනය නොගිනිය හැකි තරම් කුඩා වේ.

I. $\frac{P_C^0 - P_C}{P_C^0} = X_D = \frac{n_D}{n_D + n_C} = \frac{1}{1 + (900/18)} = \frac{1}{51} \approx 0.02$ **(02+03)**

II. $\frac{24 - P_C}{24} = 0.02 \quad : P_C = 23.52\ mmHg$ **(02+02+01)**

**6(d): ලකුණු 25**

**සටහන : භෞතික තත්ත්ව අවශ්‍ය වේ.**

7. (*a*) 25 °C දී $3Cu^{+}(aq) + Au^{3+}(aq) \rightarrow 3Cu^{2+}(aq) + Au(s)$ ප්‍රතික්‍රියාවෙහි විද්‍යුත් රසායනික හැසිරීම අධ්‍යයනය කිරීම සඳහා පහත විස්තර කරන විද්‍යුත් රසායනික කෝෂය ගොඩනගන ලදී. මෙම කෝෂය, බීකරයක ඇති 1.0 mol $dm^{-3}$ $Au(NO_3)_3(aq)$ ද්‍රාවණයක ගිල්වන ලද Au(s) ඉලෙක්ට්‍රෝඩය සහ වෙනත් බීකරයක ඇති එකිනෙක 1.0 mol $dm^{-3}$ වන $CuNO_3(aq)$ සහ $Cu(NO_3)_2(aq)$ ද්‍රාවණයක් තුළ ගිල්වා ඇති Pt(s) ඉලෙක්ට්‍රෝඩයකින් සමන්විත වේ. මෙම අර්ධ-කෝෂ දෙක සංතෘප්ත $KNO_3(aq)$ ද්‍රාවණයකින් පුරවන ලද ලවණ-සේතුවකින් සහ වෝල්ට්මීටරයකින් සම්බන්ධ කර ඇත.

25 °C දී $E^{\circ}_{Au^{3+}(aq)/Au(s)} = 1.50$ V සහ $E^{\circ}_{Cu^{2+}(aq)/Cu^{+}(aq)} = 0.16$ V වේ.

(i) මෙම විද්‍යුත් රසායනික කෝෂයෙහි දළ සටහන අඳින්න.




මෙය දළ සටහනක් බැවින්, පැති දෙක මාරු වුනත් ලකුණු ප්‍රදානය කරන්න.

(ii) මෙම විද්‍යුත් රසායනික කෝෂයෙහි ඇනෝඩය සහ කැතෝඩය හඳුනාගෙන ඒවාට අදාළ අර්ධ ප්‍රතික්‍රියා ලියන්න.

කැතෝඩය: $Au^{3+}_{(aq)} | Au_{(s)}$ : *half − reaction* : $Au^{3+}_{(aq)} + 3e \rightarrow Au_{(s)}$ **(02+03)**

ඇනෝඩය: $Cu^{2+}_{(aq)} | Cu^{+}_{(aq)}$ : *half − reaction* : $Cu^{+}_{(aq)} \rightarrow Cu^{2+}_{(aq)} + e$ **(02+03)**



Scanned with CamScanner

(iii) මෙම විද්‍යුත් රසායනික කෝෂයෙහි ධන සහ සෘණ අග්‍ර හඳුනාගන්න.

ධන අග්‍රය : $Au^{3+}_{(aq)}| Au_{(s)}$ (Au electrode) **(03)**

සෘණ අග්‍රය: $Cu^{2+}_{(aq)}| Cu^{+}_{(aq)}$ (Pt electrode) **(03)**

(iv) 25 °C දී $E^{0}_{cell}$ ගණනය කරන්න.

$$E^0_{cell} = E^0_R - E^0_L \text{ හෝ } E^0_{cathode} - E^0_{anod} \text{ හෝ } E^0_{Au^{3+}_{(aq)}|\,Au_{(s)}} - E^0_{Cu^{2+}_{(aq)}|\,Cu^{+}_{(aq)}}$$ **(04)**

$$= (1.5 - 0.16)V = 1.34\ V$$ **(02+02+01)**

(v) මෙම කෝෂය ක්‍රියාකරන විට Pt(s) ඉලෙක්ට්‍රෝඩයෙහි ස්කන්ධය වැඩි වේ ද, අඩු වේ ද, වෙනස් නොවේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

වෙනස් නොවේ. :Pt(s) ප්‍රතික්‍රියා නොකරයි සහ Cu(s) නොසෑදේ. **(04+03+03)**

(vi) කෝෂය ක්‍රියාත්මක වීමට පෙර සහ පසු Au(s)-අර්ධ කෝෂයෙහි අඩංගු වන අයනික විශේෂයන් සඳහන් කරන්න.

පෙර : $Au^{3+}_{(aq)}$ and $NO^{-}_{3(aq)}$ **(01+01)**

පසු : $Au^{3+}_{(aq)}$ , $NO^{-}_{3(aq)}$ and $K^{+}_{(aq)}$ **(01+01+01)**

(vii) 25 °C දී මිනිත්තු 30 ක් කෝෂය ක්‍රියාත්මක වූ පසු Au(s) ඉලෙක්ට්‍රෝඩය මත Au(s) 0.197 g ක් තැන්පත් විය.

I. තැන්පත් වූ Au මවුල සංඛ්‍යාව ගණනය කරන්න. (Au = 197 g $mol^{-1}$)

සෑදුණු Au(s) මවුල $= \frac{0.197\ g}{197\ g\ mol^{-1}} = 1.0 \times 10^{-3}\ mol$ **(04+01)**

II. මිනිත්තු 30 ක් තුළ කෝෂය හරහා ගමන් කළ ධාරාව නියතව තිබූ බව උපකල්පනය කරමින් එම ධාරාව (mA) ගණනය කරන්න.

ධාරාව, $I = \frac{q}{t}$ **(05)**

$$= \frac{1.0 \times 10^{-3} \times 3 \times 96500}{30 \times 60} = 161\ mA\ or\ 0.161\ A$$ **(04+01)**

**ෆැරඩේ නියතය ලෙස වෙන සංඛ්‍යාවක් හෝ සංකේතයක් භාවිතා කර ගණනය කර ඇත්නම් ලකුණු 05 ප්‍රදානය කරන්න.**

**7(a): ලකුණු 75**



Scanned with CamScanner

(*b*) (i) **A, B, C, D** හා **E** සංගත සංයෝග වේ. ඒවාට අෂ්ටතලීය ජ්‍යාමිතියක් ඇත.

I. පහත දී ඇති ලැයිස්තුවෙන් සුදුසු විශේෂ තෝරාගනිමින්, මෙම සංගත සංයෝගයන්හි ව්‍යුහ සූත්‍ර දෙන්න හෝ ව්‍යුහ අඳින්න.

$Na^+$, $Cu^+$, $Cu^{2+}$, $Br^-$, $NH_3$

**A** : ලෝහ අයනයට ලිගන වර්ග දෙකක් එක හා සමාන සංඛ්‍යාවකින් සංගත වී ඇත. එහි සංකීර්ණ අයනයට −1 ක ආරෝපණයක් ඇත.

**B** : ලෝහ අයනයට ලිගන වර්ග දෙකක් සංගත වී ඇත. **B** හි ජලීය ද්‍රාවණයකට $AgNO_3(aq)$ එක් කළ විට, සාන්ද්‍ර $NH_4OH$ හි ද්‍රාව්‍ය ලා කහ පැහැති අවක්ෂේපයක් සෑදේ.

**C** හා **D** : **C** හා **D** හි එකම මූලද්‍රව්‍යයන් අඩංගු වේ. එනමුත්, **C** හි සංකීර්ණ අයනයට −2 ක ආරෝපණයක් ඇති අතර, **D** හි එම අයනයට −3 ක ආරෝපණයක් ඇත.

**E** : ලෝහ අයනයට එක් ලිගන වර්ගයක් පමණක් සංගත වී ඇත. ජලීය ද්‍රාවණයේදී, **E** අයන දෙකක් දෙයි.

සැ.යු. : ● සංකීර්ණ අයනයක, ලිගන කිහිපයක් සංගත වූ එක් ලෝහ අයනයක් ඇත.

| | | |
|---|---|---|
| **A :** | $Na[CuBr_3(NH_3)_3]$ | **(10)** |
| **B:** | $[CuBr(NH_3)_5]Br$ | **(10)** |
| **C:** | $Na_2[CuBr_4(NH_3)_2]$ or $Na_2[CuBr_3(NH_3)_3]$ | **(10)** |
| **D:** | $Na_3[CuBr_4(NH_3)_2]$ or $Na_3[CuBr_5(NH_3)]$ | **(10)** |
| **E:** | $[Cu(NH_3)_6]Br$ | **(10)** |

II. **E** හි IUPAC නම දෙන්න.

hexaamminecopper(I) bromide **(05)**

**7(b) (i) : ලකුණු 55**



Scanned with CamScanner

(ii) X හා Y *d*-ගොනුවේ M(II) නම් ලෝහ අයනයක සංකීර්ණ අයන වේ.
ඒවාට තලීය සමචතුරස්‍රාකාර ජ්‍යාමිතියක් ඇත.
X : එතිලීන්ඩයිඇමීන් පමණක් M(II) ට සංගත වී ඇත.
Y : එතිලීන්ඩයිඇමීන් හා $H_2O$, M(II) ට සංගත වී ඇත.
X හා Y හි ව්‍යුහ සූත්‍ර ලියා, ඒවායෙහි ව්‍යුහ අඳින්න.

සැ.යු. :
- සංකීර්ණ අයනයක, ලිගන කිහිපයක් සංගත වූ එක් ලෝහ අයනයක් ඇත.
- එතිලීන්ඩයිඇමීන්හි ව්‍යුහය $NH_2—CH_2—CH_2—NH_2$ වේ.
- එතිලීන්ඩයිඇමීන් N පරමාණු දෙකෙන්ම M(II) ට සංගත වේ.
- ව්‍යුහ සූත්‍රයෙහි එතිලීන්ඩයිඇමීන් නිරූපණය කිරීම සඳහා 'en' භාවිත කරන්න.

**X:** $[M(en)_2]^{2+}$




or




**Y:** $[M(en)_2(OH_2)_2]^{2+}$




or




සටහන: දායක බන්ධන වෙනුවට සහසංයුජ බන්ධන ලෙස ද නිරූපණය කළ හැක.

**(05 x 4 = 20)**

| 7(b): ලකුණු 75 |
|---|

AL ඇපි | ALapiedu.com



Scanned with CamScanner

## C කොටස — රචනා

ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න. (එක් එක් ප්‍රශ්නයට **ලකුණු** 150 බැගින් ලැබේ.)

8. (*a*) 2-Methylpropanamide ආරම්භක සංයෝගය ලෙස භාවිත කරමින් **S** සංයෝගය සෑදීම සඳහා ප්‍රතික්‍රියා පටිපාටියක් පහත දී ඇත.




**P, Q** සහ **R** සංයෝගයන්හි ව්‍යුහ ඇඳීමෙන් සහ ප්‍රතික්‍රියා **1 – 4** සඳහා සුදුසු ප්‍රතිකාරක දී ඇති ලැයිස්තුවෙන් **පමණක්** තෝරාගෙන ලිවීමෙන්, ඉහත දී ඇති ප්‍රතික්‍රියා පටිපාටිය සම්පූර්ණ කරන්න.

> **ප්‍රතිකාරක ලැයිස්තුව:**
> $LiAlH_4$/වියළි ඊතර්, $NaNO_2$, තනුක HCl, පිරිඩිනියම් ක්ලෝරෝක්‍රෝමේට් (PCC), $C_6H_5NH_2$




ප්‍රතික්‍රියා - 1 සඳහා වියළි ඊතර සඳහන් කර නොමැති නම් **එක් ලකුණක්** අඩු කරන්න.

AL අපි | ALapiedu.com



Scanned with CamScanner

**8(a) ප්‍රශ්නය සඳහා විකල්ප පිළිතුර**




**8(a): ලකුණු 35**

ප්‍රතික්‍රියා - 2 සඳහා වියළි ඊතර සඳහන් කර නොමැති නම් **එක් ලකුණක්** අඩු කරන්න.

(*b*) 2-Methyl-2-butene සහ HBr අතර සිදුවන ප්‍රතික්‍රියාව සලකන්න.

(i) මෙම ප්‍රතික්‍රියාවේදී සෑදීමට ඉඩ ඇති ඵල දෙකෙහි ව්‍යුහ දෙන්න.

මෙහිදී සෑදෙන ඵල දෙක වන්නේ,

$CH_3CH(Br)CH(CH_3)CH_3$ සහ $CH_3CH_2C(Br)(CH_3)CH_3$ (05) + (05)

(ii) ප්‍රතික්‍රියා වර්ගය සඳහන් කරමින් සහ ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය සලකමින්, මෙම ඵල දෙකෙන් කුමක් ප්‍රධාන ඵලය වන්නේදැයි පැහැදිලි කරන්න.

මෙය ඉලෙක්ට්‍රොෆිලික ආකලන ප්‍රතික්‍රියාවක් වන අතර කාබොකැටායනයක් හරහා සිදු වේ. (04)

මෙහිදී සෑදෙන කාබොකැටායන දෙක වන්නේ

$CH_3\overset{+}{C}HCH(CH_3)CH_3$ (A) සහ $CH_3CH_2\overset{+}{C}(CH_3)CH_3$ (B) (03) + (03)

**B** යනු තෘතියික කාබොකැටායනයක් බැවින් එය **A** ට වඩා ස්ථායි වේ. එබැවින්, ප්‍රතික්‍රියාව **B** කාබොකැටාය හරහා සිදු වේ. (03) + (03)

එබැවින් ප්‍රධාන ඵලය වන්නේ:

$CH_3CH_2C(Br)(CH_3)CH_3$ (04)

**8(b): ලකුණු 30**

AL ඇඩ | ALapiedu.com



Scanned with CamScanner

(c) ෆීනෝල් සහ ඇසිටික් අම්ලය යන සංයෝග දෙක සලකන්න.

(i) මෙම සංයෝග දෙකෙන් වඩා ආම්ලික වන්නේ කුමක්දැයි සඳහන් කරන්න.

(i)  (06) name can be accept

(ii) එක් එක් සංයෝගය සඳහා ජලීය මාධ්‍යයේදී පවතින සමතුලිතතාවයන් සඳහා රසායනික සමීකරණ ලියන්න.

(ii)  (05)

or 

if it is not 'aq' marks not given

 (05)

(iii) ඉහත (ii) පිළිතුරෙහි ලියා ඇති, කාබනික රසායනික විශේෂයන්හි සම්ප්‍රයුක්ත ව්‍යුහ අඳින්න.

(iii)

I  (02)

 (02)

II  (05)

 (05)

are not compulsory

ALඅපි | ALapiedu.com



Scanned with CamScanner

(iv) සම්ප්‍රයුක්ත ව්‍යුහ සලකමින්, ඉහත (i) කොටසේ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

සම්ප්‍රයුක්තතාවය මගින් ඇසිටේට් ඇනායනයේ හා ෆීනොක්සයිඩ් ඇනායනයේ ස්ථායිකරණය (Stabilization) පිළිවෙලින් ඇසිටික් අම්ලය හා ෆීනෝල් හි ස්ථායිකරණයට වඩා වැඩිය. මෙයට හේතුව වන්නේ ඇසිටික් අම්ලය හා ෆීනෝල් හි සම්ප්‍රයුක්ත ව්‍යුහවල මෙන් නොව, ඒවායේ ඇනයන වල සම්ප්‍රයුක්ත ව්‍යුහවල ආරෝපණ විභේදනයක් නොමැතිවීමය. **(02)**

සම්ප්‍රයුක්තතාවය මගින් ඇසිටික් අම්ලයට සාපේක්ෂව ඇසිටේට් අයනයේ ස්ථායිකරණය, ෆීනෝල්වලට සාපේක්ෂව ෆීනොක්සයිඩ් ඇනායනයේ ස්ථායිකරණයට වඩා වැඩිය. **(08)**

මෙයට හේතුව වන්නේ, ඇසිටේට් අයනය ස්ථායිකරණයේදී එහි සෘණ ආරෝපණය ඔක්සිජන් පරමාණු දෙකක් මත විස්ථානගත වන අතර, **(05)** ෆීනොක්සයිඩ් ඇනායනයේ සෘණ ආරෝපණය විස්ථානගත වන්නේ ඔක්සිජන් පරමාණු එකක් හා ඇරෝමැටික වලයේ (ඔක්සිජන්වලට වඩා විද්‍යුත් සෘණතාවය අඩු) කාබන් පරමාණු මතය. **(05)** එම නිසා, ඇසිටික් අම්ලය ෆීනෝල් වලට වඩා ආම්ලික වේ.

**8(c): ලකුණු 50**

(*d*) පහත දැක්වෙන පරිවර්තනය පියවර **පහකට (05)** නොවැඩි සංඛ්‍යාවකින් ඔබ සිදු කරන ආකාරය පෙන්වන්න.







හෝ

AL අපි | ALapiedu.com



Scanned with CamScanner




**8(d): ලකුණු 35**

සටහන - වෙනත් පිළිතුරු ඉදිරිපත් කර ඇත්නම් පහත ආකාරයට ලකුණු ප්‍රදානය කරන්න.

පියවර 5 කට වඩා වැඩි නම් කිසිදු පියවරකට ලකුණු ප්‍රදානය නොකරන්න.

- සුදුසු කාණ්ඩයක් C - C බන්ධනයක් මගින් බෙන්සීන් වලයට සම්බන්ධ කිරීම — ලකුණු 15
- නිවැරදි ඇල්කොහොලය සහ අම්ලය අතර එස්ටරීකරණය ප්‍රතික්‍රියාව — ලකුණු 10
- ලකුණු දීමේ පටිපාටියට අදාළ නිවැරදි අනිකුත් ප්‍රතික්‍රියා — ලකුණු 10

9. (*a*) **Y** ජලීය ද්‍රාවණයෙහි **P, Q, R** හා **S** කැටායන හතරක් අඩංගු වේ. මෙම කැටායන හඳුනාගැනීම සඳහා පහත දී ඇති පරීක්ෂණ පිළිවෙළින් සිදු කරන ලදී.

| | පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|---|
| 1 | තනුක HCl මගින් **Y** ආම්ලික කරන ලදී. | සුදු අවක්ෂේපයක් ($P_1$) |
| 2 | $P_1$ පෙරා වෙන් කර, ලැබෙන පෙරණය තුළින් $H_2S$ බුබුලනය කරන ලදී. | අවක්ෂේපයක් නොමැත |
| 3 | $H_2S$ මුළුමනින්ම ඉවත් කිරීම සඳහා ඉහත පෙරණය නටවන ලදී. සාන්ද්‍ර $HNO_3$ බිංදු කිහිපයක් එක් කර, ද්‍රාවණය නටවා, සිසිල් කර, $NH_4Cl/NH_4OH$ එක් කරන ලදී. | දුඹුරු අවක්ෂේපයක් ($Q_1$) |
| 4 | $Q_1$ පෙරා වෙන් කර, ලැබෙන පෙරණය තුළින් $H_2S$ බුබුලනය කරන ලදී. | කළු අවක්ෂේපයක් ($R_1$) |
| 5 | $R_1$ පෙරා වෙන් කර, $H_2S$ මුළුමනින්ම ඉවත් කිරීම සඳහා ලැබෙන පෙරණය නටවා, සිසිල් කර, $NH_4Cl/NH_4OH$ එක් කරන ලදී. මෙම ද්‍රාවණය රත් කර, වැඩිපුර $(NH_4)_2CO_3(aq)$ එක් කරන ලදී. | සුදු අවක්ෂේපයක් ($S_1$) |

අවක්ෂේප සඳහා පහත පරීක්ෂා සිදු කරන ලදී.

| අවක්ෂේපය | පරීක්ෂාව | නිරීක්ෂණය |
|---|---|---|
| $P_1$ | $P_1$ ට තනුක $NH_4OH$ එක් කරන ලදී. | අවර්ණ ද්‍රාවණයක් ($P_2$) |
| | $P_2$ හි කොටස්වලට වෙන් වෙන් වශයෙන් පහත ද්‍රාවණ එක් කරන ලදී.<br>I. KI(aq)<br>II. $Na_2S_2O_3(aq)$ / Δ | <br><br>තද කහ අවක්ෂේපයක් ($P_3$)<br>කළු අවක්ෂේපයක් ($P_4$) |
| $Q_1$ | තනුක $HNO_3$ හි $Q_1$ ද්‍රවණය කරන ලදී. ලැබෙන ද්‍රාවණයෙහි කොටස්වලට වෙන් වෙන් වශයෙන් පහත ද්‍රාවණ එක් කරන ලදී.<br>I. $NH_4SCN(aq)$<br>II. $K_4[Fe(CN)_6](aq)$ | <br><br>තද රතු ද්‍රාවණයක් ($Q_2$)<br>තද නිල් අවක්ෂේපයක් ($Q_3$) |
| $R_1$ | උණුසුම් තනුක HCl හි $R_1$ ද්‍රවණය කර, ද්‍රාවණය සිසිල් කර, ලැබෙන ද්‍රාවණයෙහි කොටස්වලට වෙන් වෙන් වශයෙන් පහත ද්‍රාවණ එක් කරන ලදී.<br>I. තනුක $NH_4OH$ බිංදු කිහිපයක්<br>II. වැඩිපුර තනුක $NH_4OH$<br>III. තනුක $NH_4OH$ බිංදු කිහිපයක්/ ඩයිමෙතිල්ග්ලයොක්සිම් (DMG) | <br><br>කොළ අවක්ෂේපයක් ($R_2$)<br>තද නිල් ද්‍රාවණයක් ($R_3$)<br>තද රතු අවක්ෂේපයක් ($R_4$) |
| $S_1$ | තනුක HCl හි $S_1$ ද්‍රවණය කරන ලදී. ලැබෙන ද්‍රාවණයෙහි කොටස්වලට වෙන් වෙන් වශයෙන් පහත ද්‍රාවණ එක් කරන ලදී.<br>I. තනුක $H_2SO_4$<br>II. $K_2CrO_4(aq)$<br>$S_1$ පහන්සිළු පරීක්ෂාවට භාජනය කරන ලදී. | <br><br>තනුක $HNO_3$ හි අද්‍රාව්‍ය සුදු අවක්ෂේපයක් ($S_2$)<br>කහ අවක්ෂේපයක් ($S_3$)<br>ලා කොළ දැල්ලක් |

**P, Q, R** සහ **S** කැටායන හතර හඳුනාගන්න. එක් එක් කැටායනය ආශ්‍රිත සංයෝග/විශේෂ $P_1$ - $P_4$, $Q_1$–$Q_3$, $R_1$–$R_4$ සහ $S_1$–$S_3$ හි රසායනික සූත්‍ර ලියන්න.

**සැ.යු.** : රසායනික සමීකරණ සහ හේතු **අනවශ්‍යයි**.

(a)

| | | |
|---|---|---|
| P: | $Ag^{+}$ | **(05)** |
| Q: | $Fe^{2+}$ or $Fe^{3+}$ | **(05)** |
| R: | $Ni^{2+}$ | **(05)** |
| S: | $Ba^{2+}$ | **(04)** |

| | | | |
|---|---|---|---|
| $P_1$: | $AgCl$ | **(04)** | |
| $P_2$: | $[Ag(NH_3)_2]^{+}$ | **(04)** | $OH^-$ හෝ $Cl^-$ අයන සංකීර්ණයෙන් පිට පැවතිය හැක./ ප්‍රතිඅයන ලෙස |
| $P_3$: | $AgI$ | **(04)** | |
| $P_4$: | $Ag_2S$ | **(04)** | |

| | | |
|---|---|---|
| $Q_1$: | $Fe(OH)_3$ | **(04)** |
| $Q_2$: | $Fe(SCN)_3$ or $[Fe(SCN)(H_2O)_5]^{2+}$ | **(04)*** |
| $Q_3$: | $Fe_4[Fe(CN)_6]_3$ | **(04)** |

*$SCN^-$ සංඛ්‍යාව 1-6 දක්වා වෙනස් විය හැක. නමුත් එම සංඛ්‍යාව අනුව සංකීර්ණයේ ආරෝපණය විය යුතුය.

| | | |
|---|---|---|
| $R_1$: | $NiS$ | **(04)** |
| $R_2$: | $[Ni(OH)_2]$ | **(04)** |
| $R_3$: | $[Ni(NH_3)_6]^{2+}$ | **(04)** |
| R4: | $[Ni(DMG)_2]$ | **(04)**** |

**Ni-DMG සංකීර්ණය පිළිගත හැක.

| | | |
|---|---|---|
| $S_1$: | $BaCO_3$ | **(04)** |
| $S_2$: | $BaSO_4$ | **(04)** |
| $S_3$: | $BaCrO_4$ | **(04)** |

**9(a): ලකුණු 75**

AL ඇපි | ALapiedu.com



Scanned with CamScanner

(*b*) සිඩරයිට් (siderite) නැමති ඛනිජයෙහි ප්‍රධාන වශයෙන් $FeCO_3$ අඩංගු වේ. හුනුගල්වල ඇති $CaCO_3$ හි අඩංගු කැල්සියම් අයන ($Ca^{2+}$), දිගු කලක් තිස්සේ ෆෙරස් අයන ($Fe^{2+}$) මඟින් විස්ථාපනය වූ විට සිඩරයිට් සෑදේ. මේ නිසා සිඩරයිට්හි ඇති $FeCO_3$, $CaCO_3$ සමග මිශ්‍රව පවතී. මීට අමතරව සිලිකා වැනි අපද්‍රව්‍ය ද සුළු වශයෙන් සිඩරයිට්වල අඩංගු වේ.

මෙවැනි සිඩරයිට් සාම්පලයක 8.5 g, ඔක්සිජන් රහිත තත්ත්ව යටතේ 900 °C හිදී නියත ස්කන්ධයක් දක්වා තාප වියෝජනය කරන ලදී. එවිට ඉතිරිවන සාම්පලයේ ස්කන්ධය 5.2 g විය. තාප වියෝජනයේදී $CaCO_3$, $CaO$ බවටත් $FeCO_3$, $FeO$ බවටත් පරිවර්තනය වේ.

ඉහත සිඩරයිට් සාම්පලයෙන් තවත් 1.7 g වැඩිපුර තනුක $H_2SO_4$ අම්ලයෙහි දියකර, පෙරා, ලැබෙන ද්‍රාවණය $100.00\ cm^3$ දක්වා ආස්‍රැත ජලයෙන් තනුක කරන ලදී. මෙහිදී ලැබෙන ද්‍රාවණයෙන් $25.00\ cm^3$, $0.04\ mol\ dm^{-3}$ $KMnO_4$ ද්‍රාවණයක් සමග අනුමාපනය කළ විට අන්ත ලක්ෂ්‍යයේදී $KMnO_4$ පාඨාංකය $12.50\ cm^3$ විය.

සිඩරයිට් සාම්පලයෙහි ඇති Fe සහ Ca හැර වෙනත් ලෝහ ප්‍රමාණ නොගිනිය යුතු තරම් කුඩා යැයි උපකල්පනය කරන්න.

(C = 12, O = 16, Ca = 40, Fe = 56)

(i) සිඩරයිට් සාම්පලයෙහි ඇති $CaCO_3$ ස්කන්ධ ප්‍රතිශතය ගණනය කරන්න.

$FeCO_3 \longrightarrow FeO + CO_2$ **(02)**

$CaCO_3 \longrightarrow CaO + CO_2$ **(02)**

සෑදුණු $CO_2$ ප්‍රමාණය $= \frac{8.5\ g - 5.2\ g}{44} = 0.075$ mol **(02) + (02)**

$FeCO_3 + CaCO_3$ මුළු මවුල ගණන $= 0.075$ mol **(02)**

$Fe^{+2}$ ද්‍රාවණ $25.00\ cm^3$ ක් සමග ප්‍රතික්‍රියා කිරීමට අවශ්‍ය $KMnO_4$ ප්‍රමාණය

$= 0.04 \times 12.5 \times 10^{-3}$ or $5 \times 10^{-4}$ mol **(03)**

$Fe^{2+}$ ද්‍රාවණ $100\ cm^3$ සමග ප්‍රතික්‍රියා වීමට අවශ්‍ය වන $KMnO_4$ ප්‍රමාණය (හෝ සිඩරයිට් සාම්පලයේ 1.7 g ක් සමග ප්‍රතික්‍රියාමවීට අවශ්‍ය $KMnO_4$ ප්‍රමාණය )

$= 5 \times 10^{-4} \times \frac{100}{25}$ or $2 \times 10^{-3}$ mol **(03)**

සිඩරයිට් සාම්පලයේ 8.5 g ක් සමග ප්‍රතික්‍රියා වීමට අවශ්‍ය $KMnO_4$

$= 2 \times 10^{-3} \times \frac{8.5}{1.7}$ හෝ 0.01 mol **(03)**

*පියවර එකතු කළ හැක.*

$5Fe^{2+} + MnO_4^- + 8H^+ \longrightarrow 5Fe^{3+} + Mn^{2+} + 4H_2O$ **(04)**

(තුලිත අයනික හෝ රසායනික සමීකරණය)

සිඩරයිට් සාම්පලයේ 8.5 g ක ඇති $FeCO_3$ ප්‍රමාණය $= 0.01 \times 5 = 0.05$ mol **(03)**

සිඩරයිට් සාම්පලයේ 8.5 g ක ඇති $CaCO_3$ ප්‍රමාණය $= 0.075 - 0.05 = 0.025$ mol **(03)**

$CaCO_3$ ස්කන්ධය $= 0.025 \times 100$ or 2.5 g **(03)**

$CaCO_3$ මවුලික ස්කන්ධය 100 සඳහා **(01)**

$CaCO_3$ ස්කන්ධ ප්‍රතිශතය $= \frac{2.5\ g}{8.5\ g} \times 100 = 29.4\%$ **(03) + (02)**



AL ඇපි | ALapiedu.com
Scanned with CamScanner

සටහන: ස්කන්ධ පරිවර්තනය (8.5 සිට 1.7 හෝ 1.7 සිට 8.5) ඕනෑම පියවරකදී සිදු කළ හැකි අතර අදාළ ලකුණු 03 ප්‍රදානය කළ හැක.

**9(b)(i) ලකුණු 38**

**විකල්ප පිළිතුර**

$FeCO_3 \longrightarrow FeO + CO_2$ **(02)**

$CaCO_3 \longrightarrow CaO + CO_2$ **(02)**

අවශ්‍ය $KMnO_4$ ප්‍රමාණය = $0.04 \times 12.5 \times 10^{-3}$ or $5 \times 10^{-4}$ mol **(03)**

$5Fe^{2+} + MnO_4^- + 8H^+ \longrightarrow 5Fe^{3+} + Mn^{2+} + 4H_2O$ **(04)**

25 $cm^3$ ක $Fe^{2+}$ ප්‍රමාණය $= 5 \times 10^{-4} \times 5 = 2.5 \times 10^{-4}$ mol **(03)**

100 $cm^3$ ක $Fe^{2+}$ ප්‍රමාණය $= 2.5 \times 10^{-4} \times 4 = 1 \times 10^{-2}$ mol **(03)**

සිඩරයිට් සාම්පලයේ 8.5 g ක $Fe^{2+}$ ප්‍රමාණය $= \frac{1 \times 10-2 \text{ mol}}{1.7\ g} \times 8.5$ g

$= 0.05$ mol **(03)**

$FeCO_3$ මගින් ලැබෙන $CO_2$ ප්‍රමාණය $= 0.05 \times 44$ g $mol^{-1}$

$CO_2$ මවුලික ස්කන්ධය 44 සඳහා **(01)**

$= 2.2$ g **(03)**

$CO_2$ මුළු ස්කන්ධය $= 8.5 \text{ g} - 5.2 \text{ g} = 3.3$ g **(02)**

$CaCO_3$ මගින් ලැබෙන $CO_2$ ප්‍රමාණය $= 3.3 \text{ g} - 2.2 \text{ g} = 1.1$ g **(02)**

$CaCO_3$ මවුල ප්‍රමාණය $= \frac{13.3 \text{ g} - 2.2 \text{ g}}{44} = 0.025$ mol * **(01)**

$CaCO_3$ ස්කන්ධය $= 0.025 \text{ mol} \times 100 \text{ g mol}^{-1}$

$= 2.5$ g **(03)**

$CaCO_3$ මවුලික ස්කන්ධය සඳහා **(01)**

of $CaCO_3$ ස්කන්ධ % $= \frac{2.5 \text{ g}}{8.5 \text{ g}} \times 100 = 29.4\%$ **(03) + (02)**

ALඅපි | ALapiedu.com

(ii) සිඩරයිට් සාම්පලයෙහි ඇති $CaCO_3$ වලට අමතරව ඇති අපද්‍රව්‍යවල ප්‍රතිශතය ගණනය කරන්න.

සිඩරයිට් සාම්පලය 8.5 g ක ඇති $FeCO_3$ ස්කන්ධය = 0.05 × 116

= 5.8 g (03)

$FeCO_3$ මවුලික ස්කන්ධය සඳහා 116 සඳහා (01)

$FeCO_3$ හා $CaCO_3$ ස්කන්ධය = 2.5 + 5.8 = 8.3 g (03)

සංශුද්ධතා% = $\frac{8.5-8.3}{8.5} \times 100$ (03)

= 2.35% (02)

**9(b)(ii) ලකුණු 12**

**9(b) (ii) සඳහා විකල්ප පිළිතුර**

$CaCO_3$ ස්කන්ධ % = 29.4%

$FeCO_3$ ස්කන්ධය = 0.05 ×116 or 5.8 g (02)

$FeCO_3$ මවුලික ස්කන්ධය 116 සඳහා (01)

$FeCO_3$ ස්කන්ධය % = $\frac{5.8}{8.5} \times 100\%$ (02)

= 68.24% (02)

මුළු % = 29.4 + 68.24 = 97.64% (03)

සංශුද්ධතා % = 100 - 97.64 = 2.36% (02)

***දෙවන දශම ස්ථානයේ ඇති වෙනස නොසලකා හරින්න.***

**9(b)(ii) ලකුණු 12**

(iii) සිඩරයිට් සාම්පලයෙහි 8.5 g ඔක්සිජන් හමුවේ තාප වියෝජනය කළ විට $FeCO_3$, $Fe_2O_3$ සහ $Fe_3O_4$ මවුල අනුපාතය 1:1 වන පරිදි වියෝජනය වන අතර $CaCO_3$, CaO බවට වියෝජනය වේ. මෙම තාප වියෝජනයෙන් පසුව ඉතිරිවන අවශේෂයෙහි ස්කන්ධය ගණනය කරන්න.

සිඩරයිට් 8.5g ක සාම්පලයක $FeCO_3$ මවුල 0.05 ක් ඇත.

$$5FeCO_3 + O_2 \longrightarrow Fe_2O_3 + Fe_3O_4 + 5CO_2$$ (06)

මවුල 0.05    0.01    0.01    (01) + (01) + (01)*

$Fe_2O_3$ ස්කන්ධය = 0.01 × 160 = 1.6 g (02)

$Fe_2O_3$ මවුලික ස්කන්ධය 160 සඳහා (01)

*මෙම ලකුණු 03 මෙහිදී හෝ මෙම අගයන් ගණනයේදී යෙදීමේදී ප්‍රදානය කරන්න.

$$CaCO_3 \longrightarrow CaO + CO_2$$

මවුල 0.025    0.025    (01) + (01)*

* මෙම ලකුණු 02 මෙහිදී හෝ මෙම මවුල සංඛ්‍යා ගණනයේදී යෙදීමේදී ප්‍රදානය කරන්න.



Scanned with CamScanner

$Fe_3O_4$ ස්කන්ධය = 0.01 × 232 = 2.32 g (02)

$Fe_3O_4$ මවුලික ස්කන්ධය 232 සඳහා (01)

CaO ස්කන්ධය = 0.025 × 56 = 1.4 g (02)

for CaO මවුලික ස්කන්ධය 56 සඳහා (01)

අවශේෂයේ ස්කන්ධය = 1.6 + 2.32 + 1.4 + 0.2 = 5.52 g (03) + (02)

**9(b)(iii) ලකුණු 25**

**9(b) (iii) සඳහා විකල්ප පිළිතුර**

$5FeCO_3 + O_2 \longrightarrow Fe_2O_3 + Fe_3O_4 + 5CO_2$ **(06)**

මවුල 0.05 0.01 0.05 **(01) + (01) + (01)***

$CaCO_3 \longrightarrow CaO + CO_2$

මවුල 0.025 0.025 **(01) + (01)***

*මවුල ප්‍රමාණ සඳහා දී ඇති ලකුණු 05, ගණනය කිරීමේදී එම මවුල ප්‍රමාණ සඳහන් කරයි නම් එම අවස්ථාවට ලකුණු 05 ක් ලබා දෙන්න.

සිඩරයිට් සාම්පලයේ ආරම්භක ස්කන්ධය:

සිඩරයිට් සාම්පලය 8.5 g + 0.01 මවුල (0.32 g) = 8.83 g **(03)**

අඩු වූ ස්කන්ධය = 0.05 × 44 + 0.025 × 44 **(03)**

($FeCO_3$ මගින්) ($CaCO_3$ මගින්)

2.2 g + 1.1 g = 3.3 g **(03)**

අවශේෂයේ ස්කන්ධය = 8.82 - 3.3 = 5.52 g **(03) + (02)**

**9(b) (iii) ලකුණු 25**

**9(b) ලකුණු 75**

**10.** *(a)* $TiO_2$ හි කාර්මික නිෂ්පාදනය සලකන්න.

(i) රූටයිල් මගින් $TiO_2$ නිපදවන ක්‍රියාවලිය නම් කරන්න.

ක්ලෝරයිඩ් ක්‍රියාවලිය **(05)**

(ii) ඉහත ක්‍රියාවලියට අවශ්‍ය වන අමුද්‍රව්‍ය (රූටයිල් හැර) නම් කරන්න.

කෝක් **(04)**

$Cl_2$ **(04)**

$O_2$(වාතය) **(04)**

(iii) ඉහත ක්‍රියාවලිය හා සම්බන්ධ ප්‍රධාන පියවර දෙක නම් කරන්න.

ක්ලෝරිනීකරණය **(04)**

ඔක්සිකරණය **(04)**



Scanned with CamScanner

(iv) ඉහත එක් එක් පියවර යටතේ සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ දෙන්න.

<u>ක්ලෝරිනීකරණය</u>

$TiO_2(s) + C(s) \rightarrow Ti(s) + CO_2(g)$ --------(A) **(05)**

රූටයිල් සහ කෝක් මිශ්‍රණය මතින් ක්ලෝරීන් වායු ධාරාවක් යවනු ලැබේ.

$Ti(s) + 2Cl_2(g) \rightarrow TiCl_4(g)$ --------(B) **(05)**

**හෝ**

(A) සහ (B) ප්‍රතික්‍රියා දෙක එකතු කළ හැක.

$TiO_2(s) + C(s) + 2Cl_2 \rightarrow TiCl_4(g) + CO_2(g)$ **(10)**

**සටහන:** තුලිත සමීකරණ සඳහා ලකුණු ප්‍රදානයේදී භෞතික තත්ත්ව අවශ්‍ය නොවේ.

<u>ඔක්සිකරණය</u>

$TiCl_4$ ඔක්සිජන් සමග ප්‍රතික්‍රියා කරයි. $TiO_2$ සෑදේ.

$TiCl_4(g) + O_2(g) \rightarrow TiO_2(s) + 2Cl_2(g)$ **(05)**

**සටහන:** භෞතික තත්ව අවශ්‍ය නොවේ.

(v) ඉහත ක්‍රියාවලිය ගෝලීය උණුසුම ඉහළ යෑමට දායක වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

ඉන්ධන/ කෝක් දහනය **(05)**

ක්‍රියාවලිය තුළ දී $CO_2$ නිපදවේ. **(05)**

**10(a): ලකුණු 50**

(*b*) විවිධ පාරිසරික ගැටලු සඳහා දායකවන දූෂක අතර NO, $NO_2$, $SO_2$, $CH_4$, $CF_2Cl_2$ සහ $CF_2HCl$ ඇත. හැලජනීකෘත සංයෝග දෙක හැරුණු විට අනෙක්වා ස්වාභාවික ක්‍රියාවලි හා මිනිස් ක්‍රියාකාරකම් යන දෙකෙන්ම පරිසරයට නිකුත් වේ.

(i) NO නිදහස් කරනු ලබන ස්වාභාවික ක්‍රියාවලි හා මිනිස් ක්‍රියාකාරකම් **දෙක බැගින්** සඳහන් කරන්න.

ස්වාභාවික ක්‍රියාවලි : අකුණු ගැසීමේ (විදුලි කෙටීම) ක්‍රියාවලිය, නයිට්‍රිහාරී බැක්ටීරියා මගින් යමහල් විදාරණය මගින්

*ඕනෑම දෙකක්*

මානව ක්‍රියාකාරකම් : වාහන ධාවනයේ දී සිදුකරන ඉන්ධන දහනය කාර්මික විමෝචන (කර්මාන්ත නිකුතු, කර්මාන්ත වලින් පියවන වායු), 900 °C ට වඩා උෂ්ණත්වයේ දී සිදුවන දහන ක්‍රියාවලි

*ඕනෑම දෙකක්*

**(02 x 4 = ලකුණු 08)**

ALapiedu.com



Scanned with CamScanner

(ii) **අම්ල වැස්ස, ගෝලීය උණුසුම ඉහළ යෑම, ඕසෝන් වියන හායනය සහ ප්‍රකාශ රසායනික ධූම්කාව ප්‍රධාන වායුගෝලීය ගැටලු හතරක් වේ. මෙම එක් එක් සංසිද්ධිය කෙටියෙන් විස්තර කර එම එක එකක් සඳහා සැලකිය යුතු දායකත්වයක් දක්වන වායු දෙක බැගින් ඉහත ලැයිස්තුවෙන් හඳුනාගන්න.**

අම්ල වැසි : වායුගෝලයේ ඇති ආම්ලික සංයෝග වායුගෝලයේ වර්ෂණය මගින් ලැබීම

ගෝලීය උණුසුම : හරිතාගාර වායු මට්ටම ඉහළ යාම නිසා වායු ගෝලීය උෂ්ණත්වය ඉහළයාම

ඕසෝන් වියන හායනය : ඕසෝන් බිඳවැටීම උත්ප්‍රේරණය කරන මුක්ත ඛණ්ඩක හේතුවෙන් ස්ථර ගෝලයේ ඕසෝන් මට්ටම පහළ යෑම

ප්‍රකාශ රසායනික ධූම්කාව : සූර්යාලෝකය හමුවේ පහළ වායුගෝලයේ තුළ සිදුවන රසායනික ප්‍රතික්‍රියා ශ්‍රේණියක් හේතුවෙන් ඇතිවන ධූමාරය සහ මීදුම

**(02 x 4 = ලකුණු 08)**

අම්ල වැසි සඳහා දායක වන විශේෂ: NO, $NO_2$, $SO_2$
ගෝලීය උණුසුම සඳහා දායක වන විශේෂ: $CH_4$, $CF_2Cl_2$, $CF_2HCl$
ඕසෝන් වියන හායනය සඳහා දායක වන විශේෂ: NO, $NO_2$, $CF_2Cl_2$, $CF_2HCl$
ප්‍රකාශ රසායනික ධූම්කාව සඳහා දායක වන විශේෂ: NO, $NO_2$

*ඕනෑම දෙකක්*

**ලියා ඇති පළමු පිළිතුරු දෙක සලකන්න.**

**(02 x 8 = ලකුණු 16)**

(iii) **ඕසෝන් වියන ආරක්ෂා කරගැනීමට දරන උත්සාහයක් ලෙස $CF_2Cl_2$ වලට විකල්පයක් ලෙස $CF_2HCl$ හඳුන්වාදෙන ලද්දේ මන්දැයි පැහැදිලි කරන්න.**

පරිවර්තී ගෝලය තුළදී $CF_2Cl_2$ ප්‍රතික්‍රියාකාරී නොවේ. **(2)** $CF_2HCl$ තුළ H පරමාණු අඩංගු වීම හේතුවෙන් එය $CF_2Cl_2$ ට වඩා ප්‍රතික්‍රියාශීලී වේ. **(2)** එබැවින් $CF_2HCl$ ස්ථර ගෝලය වෙත ළඟාවීමට ඇති හැකියාව $CF_2Cl_2$ ට වඩා අඩු වේ. **(2)** එබැවින් $CF_2HCl$ මගින් මගින් Cl මුක්තඛණ්ඩක සෑදීමට දක්වන දායකත්වය $CF_2Cl_2$ ට වඩා අඩුවේ. **(2)**

එහෙයින්, Cl මුක්ත ඛණ්ඩක සෑදීම කෙරෙහි $CF_2HCl$ හි දායකත්වය $CF_2Cl_2$ වලට වඩා අඩුය.

**(02 x 4 = ලකුණු 08)**

(iv) **සල්ෆර් අඩංගු ගල් අඟුරු ඉන්ධනයක් ලෙස භාවිත කරන කර්මාන්ත කලාපයක් ආශ්‍රිත ජලාශවල මත්ස්‍යයන් මිය යන බව වාර්තා වී ඇත. මෙම පාරිසරික ගැටලුව පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රමයක් හේතු දක්වමින් යෝජනා කරන්න.**

S අඩංගු ගල් අඟුරු දහනය මගින් වායුගෝලයට $SO_2$ නිකුත් කරයි. **(2)** වායුගෝලයේදී $SO_2$ ඔක්සිකරණය වී පසුව ජලයේ දිය වී $H_2SO_4$ අම්ලය සාදයි. මෙමගින් ආම්ලික වර්ෂණය ඇති වන අතර මසුන් මරණයට පත්වේ. **(2)** ආම්ලික වර්ෂණය වැළැක්වීමට වායුගෝලයට නිදහස්කිරීමට පෙර $SO_2$ ඉවත් කළ යුතුය. **(2)** මේ සඳහා $CaCO_3$ හෝ ඩොලමයිට් වැනි භස්ම (හෝ වෙනත් ඕනෑම උදාහරණ) භාවිතා වේ. **(2)** මෙමගින් අම්ලය උදාසීන කර ගැටළුව අවම කරගත හැක. **(2)**

**(02 x 5 = ලකුණු 10)**

| **10(b): ලකුණු 50** |
|---|

AL අපි | ALapiedu.com



Scanned with CamScanner

(c) (i) I. බහුඅවයවීකරණ ක්‍රියාවලියේදී සිදුවන ප්‍රතික්‍රියා වර්ගය අනුව බහුඅවයවකවල වර්ගීකරණය දෙන්න.

ආකලන බහුඅවයවක

සංඝණන බහු අවයවක

**(04 x 2 = ලකුණු 08)**

II. ඉහත (I) හි ඔබ සඳහන් කළ එක් එක් බහුඅවයවක වර්ගය සඳහා ව්‍යුහ දෙක බැගින් අඳින්න.

ආකලන බහුඅවයවක

$-CH_2CH_2CH_2CH_2-$ or $-\!\!(CH_2CH_2)\!\!-_n$

$-CH_2CH(Cl)CH_2CH(Cl)-$ or $-\!\!(CH_2CH(Cl))\!\!-_n$

$-CF_2CF_2CF_2CF_2-$ or $-\!\!(CF_2CF_2)\!\!-_n$



ඕනෑම දෙකක්

සංඝණන බහු අවයව



$-HN(CH_2)_6NHC(=O)(CH_2)_4C(=O)-HN(CH_2)_6NHC(=O)(CH_2)_4C(=O)-$ or $-\!\!(HN(CH_2)_6NHC(=O)(CH_2)_4C(=O))\!\!-_n$

**(03 × 4 = ලකුණු 12)**

**10c (i) ලකුණු 20**

(ii) I. ස්වාභාවික රබර්වල පුනරාවර්තී ඒකකයේ ව්‍යුහය අඳින්න.



**(04)**

AL අපි | ALapiedu.com



Scanned with CamScanner

II. ස්වාභාවික රබර්හි ප්‍රත්‍යස්ථ ගුණය වෙනස් කිරීමට යොදාගන්නා ක්‍රියාවලිය නම් කර එය සඳහා යොදාගන්නා ද්‍රව්‍යයේ නම ලියන්න.

වල්කනයිස් කිරීම (03)

සල්ෆර් (03)

**10c (ii) ලකුණු 10**

(iii) I. ට්‍රයිග්ලිසරයිඩයක් සහ මෙතනෝල් භාවිත කරමින් ජෛව ඩීසල් සංශ්ලේෂණය කිරීම පෙන්නුම් කිරීම සඳහා තුලිත රසායනික සමීකරණයක් දෙන්න.



NaOH ලියා නැත්නම් ලකුණු 03 ක් අඩු කරන්න. (08)

II. ජෛව ඩීසල් නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රතික්‍රියා වර්ගයට දී ඇති නම ලියන්න.

ට්‍රාන්ස්එස්ටරීකරණය (04)

III. $CH_3(CH_2)_{12}COOH$ හි ට්‍රයිග්ලිසරයිඩයේ 7.22 g කින් නිපදවෙන ජෛව ඩීසල්වල ස්කන්ධය ගණනය කරන්න.
(H = 1, C = 12, O = 16)



සාපේක්ෂ අණුක ස්කන්ධය 242

සාපේක්ෂ අණුක ස්කන්ධය 722

722 g ⟶ 242 × 3 = 726 g
7.22 g ⟶ 7.26 g

ට්‍රයිග්ලිසරයිඩ මවුලික ස්කන්ධය සෙවීම ලකුණු 01
මෙතිල්එස්ටරයේ මවුලික ස්කන්ධය සෙවීම ලකුණු 01
මවුල අනුපාතය ලකුණු 02
පිළිතුර ලකුණු 04

**10c (iii) ලකුණු 20**

**10(c): ලකුණු 50**

***

AL අපි | ALapiedu.com



Scanned with CamScanner